
# සුතසෝම ජාතකය



සම්පාදක

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**

# ලක්ෂ 10 ක් අතින් ගෙවා වැල්ලවාය ප්‍රා. සභාපති ගව ඝාතකාගාරය වසයි

(මොනරාගල නයනජීව බණ්ඩාර සහ වැල්ලවාය ජී.අයි. ඉන්දික)

තම පදනමේ අරමුදලින් රුපියල් ලක්ෂ 10 ක් වැල්වාය ප්‍රාදේශීය සභාවට ගෙවා මේ වසරේ ගව මස් ටෙන්ඩරය මිලට ගෙන වැල්ලවාය ගව ඝාතකාගාරය සහ ගව මස් වෙළෙඳසල වසා දමන ලදැයි වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ සභාපති රෝහණ වන්නිආරච්චි මහතා පවසයි.

පසුගිය පළමුවැනිද සිට මෙම ගව ඝාතකාගාරය සහ වෙළෙඳසල වසා දමා ඇත.

සභාපතිගේ මේ තීරණය නිසා වසරකට අඩු ගණනේ ගවයන් 1500-2000ත් අතර ගණනකට අභය දානය ලැබේ.

වැල්ලවාය ප්‍රාදේශීය සභාවට අයත් මෙම ගව ඝාතකාගාරය හා ගව මස් වෙළෙඳසල වසරකට රුපියක් ලක්ෂ 12 සිට 14 දක්වා මුදලකට වෙන්දේසි වන බවත්, මේ වසරේ රුපියල් ලක්ෂ 10ක් ගෙවූයේ රෝහණ වන්නිආරච්චි පදනමෙන් බවත්, ගිය වසරේ ද රෝයල් කොන්ක්‍රීට් වර්ක්ස් අධිපති රංජන් ද සිල්වා මහතා රුපියල්ලක්ෂ 14ක් ගෙවා ටෙන්ඩරය මිලට නෙ ගව ඝාතකාගාරය සහ ගව මස් වෙළෙඳසල වසා දැමූ බවත් සභාපති වන්නිආරච්චි මහතා කිය.

වැල්ලවාය ගව මසින් තොර නගරයක් කිරීමට තම පදනමත්, ඊට සහාය දක්වන සංඝරත්නය හා සියලු සංවිධානත් එකමුතු වී වැඩකරන බවද සභාපතිවරයා ලංකාදීපය සමග පැවසීය.

සත්ත්ව හිංසා වැළැක්වීමේ වැඩපිළිවෙළක් ද අරඹන බව ඔහු කීවේය.

ප්‍රාදේශීය සභාපතිගේ තීරණය පිළිබඳව වැල්ලවායේ සියලු වෙහෙර විහාරවල මහා සංඝරත්නයේ ප්‍රසාදය හිමි වී ඇත.

ඌව පළාතේ ප්‍රධාන සංඝනායක ඇතිලිවැව හිමරතන හිමියන් පැවසුවේ සභාපතිගේ මේ තීරණයෙන් උපන් හා නූපන් ගවයන් දහස් ගණනකට ජීවිත දානය ලැබෙන බවයි.

ඉකුත් දිනක තණමල්විල ප්‍රදේශයේ දී වෑන් රථයක් සහ ත්‍රීරෝද රථයක් ගැටීමෙන් වැල්ලවාය ප්‍රදේශයේ පදිංචි එකම පවුලේ තිදෙනෙකු මියගිය අතර ඔවුන්ගේ අවසන් කටයුතු සිදු කෙරුණේ ද ප්‍රාදේශීය සභා සභාපති රෝහණ වන්නිආරච්චි මහතාගේ මැදිහත්වීමෙනි. මෙම අනතුරෙන් මියගිය එකම පවුලේ මව, පියා හා වැඩිමහල් දියණියටත් පින් පතමින් සහ දැනට හම්බන්තොට රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින බාල දැරියටත් ඉක්මන් සුවය ප්‍රාර්ථනා කොට වැල්ලවාය ගව ඝාතකාගාරය මේ වසරේ වසා දමන බවට ප්‍රසිද්ධියේ ප්‍රතිඥාවක් ද දී තිබිණි.

# සුතසෝම ජාතකය

සම්පාදක

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

# පෙරවදන

## "ආරොග්‍යා පරමා ලාභා"

අකුරු නමයයි වචන තුනයි බුද්ධ දේශනාවයි. පැය විසි හතරකට මෛත්‍රී භාවනාවයි. මෙලොව පරලොව සියළු යස ඉසුරු සම්පත් ලබාදී අවසානයේ නිර්වාන සම්පත්තියද, සකල සත්වයාටද යහපතක්ම වේ. ඒ කෙසේද? යත්:-

මෙම දහම් ග්‍රන්ථය විවේක සුවයෙන් යුක්තව කියවා බලන්න.

## සුතසෝම ජාතකය

ඉතාම අවිහිංසාවාදී දර්ශණයක් වූ බුදු දහම තුළ තිබෙන්නා වූ ගැඹුරු යතාර්ථයන් අවබෝධ කරගන්නා වූ පින්වත් සත්වයන්ට සසරදුක, හිය, සැකය, අවදනම අවබෝධකර දෙන්නා වූ තවත් දහම් පිඩක් වූ මෙම සුතසෝම ජාතක කථා වස්තුවෙන් පෙන්වා දෙන්දේ සියළුම සිල්පදවලට මූලික වන පඤ්චසීලය රැකීමෙන් වන "ආරෝග්‍යා පරමා ලාභා" මාතෘකාවේ මුල් සිල්පදය වූ පරපණ නැසීමේ සහ නැසීමට අනුබලදීමේ සහ රස තෘෂ්ණාවට වහල් වී මේ (සිතට වහල්වීම) අනිටු විපාකවලින් මදක් පමණයි. මෙය ධර්ම දේශනාවකට එහි අඩංගු එක් එක් කරුණු කාරනා බොහෝ තිබේ. ඒවා එකින් එක විග්‍රහකර භාවනා වඩන්න පැය විසි හතරක් නොව දවස් විසි හතරක් භාවනා වැඩූවන් නුවණින් යුතුව සිතා බැලුවොත් ඉතා දුර්ලභ මනුෂ්‍ය ආත්ම භාවයත්, සම්බුද්ධ ශාසනයක් පවත්නා කාලයත්, එම බුද්ධ ශාසනයේ හිමිතරුවන් වීමත් පඤ්චශීලය ආරක්ෂා කිරීමත්, ත්‍රිවිධ රත්නය කෙරෙහි විචිකිච්ඡාවක් නොවීමත් උඩ භාවනාමය කුසල බලයෙන් අනුන්ගේ මස්, මාංස කිරට, මිරිසට නොව තව තවත් ඉදිරියට එන නවීන විලාසයන්ටත් ගිජුවන්නේ නැත. ලිපිය දීර්ඝවන නිසා පොතෙහි අඩංගු කරුණු කාරණා තම තම නැණ පමණින්ම අවබෝධ කරගන්නා මෙන් පින්වත් ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි.

මෙම දහම් ග්‍රන්ථය සඳහා දයකත්වය සහ මා වැඩසිටි මාළිගාවිල අළුලෙන ආරණ්‍ය සේනාසනයට අඩුපාඩුවක්ව පැවති විදුලි බලය වෙනුවට එහි තිබූ සූයර්කෝෂ පණගැන්වීම සඳහා තම ශ්‍රමය, ධනය, කාලය වැය කරදීමෙන් එම ස්ථානයට ආලෝකය ලබාදීම වෙනුවෙන් මූලිකව ඉදිරිපත් වූ පීපල්ස් ලීසිං සමාගමේ (බොරැල්ල ශාඛාව) තොරතුරු තාක්ෂණ අංශයේ බුද්ධික මහතා ඇතුළු අනෙකුත් කාර්ය මණ්ඩලයේ මහත්මා සහ මහත්මීන්ටත් එවන් වටිනා ආයතන සඳහා මෙවන් අගනා පරිත්‍යාග පිරිනැමීමට ශක්තිය, බලය ලබාදෙන්නා වූ සියළුම අනුග්‍රාහක ගණුදෙනු හවතුන්ටත් මෙපින් බලයෙන් ධර්මාවබෝධය ලැබීමටත් දහම් ග්‍රන්ථයෙ සඳහන් වූ ආකාරයට අපගේ ගෞතම බුද්ධ ශාසනයේ විශේෂ

තනතුරක් ලැබූ අංගුලි මහ රහතන් වහන්සේ පෙර එක් භවයක සසර සැරිසැරීමේදී කාශ්‍යප බුදුරජාණන් වහන්සේ වෙත කිරිපිඩු පූජා කිරීමෙන්ද, වෙහෙර, විහාර ප්‍රතිසංස්කරණය කරදීමෙන් ලබාගත්තා වූ යෝධ බලය නොමගට යාම නිසා මිනීමස් කන පෝරිසාදයකු වීමද, යක්ෂයකු වී ඉපදීමද, අවසාන ආත්ම භාවයේ දහසකට අධික පිරිසක් ඝාතනය කිරීමටද සිදුවූයේ එවන් බලවත් පිංකම් කොට එම පින් යහමගට ප්‍රාර්ථනා නොකිරීමයි. එම පූර්ආදර්ශය ගෙන මෙපින්වතුන්ට අකුරේගොඩ රතනසාර හිමි වෙනුවෙන් කළා වූ ඉහත සඳහන් පුණ්‍යකර්මයන්ට අමතරව දනය නැති දින 3ක්ම දනය උයා පිස බුද්ධ පූජාව තබා කුසගිනි නිවීමත් ඉන් අනතුරුව අපට අවශ්‍ය වියලි ආහාර සපයාදීමත් අධික දුරක් පා ගමනින් යාමට තිබූ අති දුෂ්කර ප්‍රදේශයක සිට අවශ්‍ය කටයුතු සඳහා මුදල් පරිත්‍යාග කිරීමේ ආනිසංස බලයෙන් ඉහත සඳහා පින්වත් මහත්මයා ඇතුළු කාර්‍ය මණ්ඩලයටත්, අනුග්‍රාහක භවතුන්ටත් මෙපින් බලයෙන් සසර වසනාතුරු නිවන් දක්නා ජාති දක්වා සතර අපා දුකකට පත් නොවේවා, සා, පිපාසා දුකකට පත් නොවේවා, පාපමිත්‍ර ඇසුරකට පත් නොවේවායි ප්‍රාර්ථනා කරන අතරම මෙකී සියළු දෙනාගේම නමින් මිය පරලොව ගියාවූ ඥතීන්ටත් මෙපින් බලයෙන් ධර්මාවබෝධය වේවායි පතමි.

එසේම මා පැවිදි වූ දිනයේ සිට මා වෙනුවෙන් විශේෂ කාර්‍ය භාරයක් ඉෂ්ට සිද්ධ කරදුන්නා වූ අකුරේගොඩ පදංචි තුෂාර දිසානායක මහතාටත් එම මහත්මියටත් මා ගත කළ පසුගිය අති දුෂ්කර කාලවකවානුව තුළ පැවිදි දිවිය ආරක්ෂා කර ගැනීමට ධෛර්‍යය දුන්නා වූ එම පිංවත් යුවලටත් සෙත් පතමි. විශේෂයෙන් මේ වනවිට මෙවන් දහම් පොත් පහක් පමණ මුද්‍රණය කර දුන්නා වූ මුද්‍රණාලයාධිපති සිරිපාල හෙට්ටිආරච්චි මහතාටත්, එසේම එම දහම් ග්‍රන්ථ මුද්‍රණය කරදීමට බොහෝ වෙහෙසක් සහ තැපැල් ගාස්තු ඇතුළු වෙනත් අවශ්‍යතා වෙනුවෙන් කාලය, ධනය, කැපකළ සහ මාගේ වෙනත් අවශ්‍යතා වෙනුවෙන් ක්‍රියාකල පැවිදි දිවිය ඔපවත් කළ රාජගිරියේ මැද වැළිකඩ පාරේ සණස බැංකුවේ කළමනාකාරිනී ශ්‍රියානි කරුණාරත්න මහත්මිය ඇතුළු කාර්‍ය මණ්ඩලයටත්, සණස බැංකුවේ ගරු සභාපති සුනිල් අබේසුන්දර මහතා ඇතුළු ගරු අධ්‍යක්ෂ මණ්ඩලයටත් ඉහතින් සඳහන් කළ ආකාරයට ධර්මදාන කුසල බලයෙන් ඉක්මන් භවයකින්ම සියළුම සංසාර දුකින් මිදීමට හේතු වාසනා වේවායි ප්‍රාර්ථනා කරමි.

මීට මෙතැති
**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**

2014-05-13

ශ්‍රී බුද්ධ වර්ෂ 2553 කුත් මාස 2 කුත් දින 18 ක් මහා පරිනිර්වාණ යපසුකර වූ නිකිණි පුර සතරවන ශුක්‍ර දිනදීය.

රාජ්‍ය වර්ෂ 2010 අගෝ: 13 වන සිකු.

**නමෝ තසස භගවතො අරහතො සම්මා සම්බුධසස!!!**

# සුතසොම ජාතකය

තවද දීපකංකර පාදමූලයෙහි අත්පත් නිවන් හැර සත්ව කරුණාවෙන් සසරට වැද ගින්නෙහි පැසී මිහිරි වූ කිරියොදයක් සේ සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි සසර නමැති ගින්නෙන් පැසී සර්වඥනමැති අමා යොදය ඉදිමිහිරි වූ අල්පභක්ෂතිරුදක චොර අමනුෂ්‍යාදි සසර කතරින් සාර්ථවාහකයෙක් යම්සෙ සතුන් එතෙර කෙරේද එමෙන් ජාති ජරා ව්‍යාදි මරණ සංඛ්‍යාත සසර මහ කතරින් සත්වයන් ගොඩලා නිවන් නමැති පටුන් ගමට පමුණුවන්නා වූ බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක්. අඟුල්මල් තෙරුන් අරභයා මේ ජාතකය දේශනා කර වදළ සේක.

ඒ අඟුල්මල් තෙරුන් වහන්සේගෙ උත්පත්තියද මහණවීමද අන්ගුලිමාල සූත්‍රයෙහි වදළ ක්‍රමයෙන් දතයුතු උන්වහන්සේ සත්‍යක්‍රියා බලයෙන් ස්ත්‍රීන්ගෙ දරුගැබ සුවපත් කොට එතැන් පටන් සුලභව ලබන ලද ආහාරයන් ඇතිසේක් විවේකීව විදර්ශනා වඩා රහත්ව අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාට ඇතුළත් වූ සේක. එකල්හි ධර්ම සභාවෙහි වැඩහුන් භික්ෂූන් වහන්සේ ඔවුනොවුන් හා කථා කරන සේක් ඇවැත්නි අන්ගුලිමාලයන් වැනි ලේ තැවරුණු අත් ශරීර ඇතුව සිටි භයානක මිනීමරුවකු පවා ශක්තිය, බලය, ආයුධ පවා නොමැතිව අවිහිංසාවෙන් කරුණාවෙන්, මෛත්‍රියෙන් දමනය කරගත් අපගෙ භාග්‍යවත් අභීත් සම්බුදු රජාණන් වහන්සෙගෙ මහා කරුණා ගුණය ආශ්චර්යයී සේ යයි ගුණ වර්ණනා කරමින් වැඩහුන් සේක.

සර්වඥයන් වහන්සෙ ගන්ධ කුටියෙහි වැඩහුන්සේක් ධර්ම සභා මණ්ඩපයෙහි පැවති කථාව දිව්‍යකණින් අසා වදරා අනොපමෙය්‍ය වූ

බුඩවිලාසයෙන් ධර්‍ම සභාවට වැඩ පණවන ලද බුඩාසනමස්තකයෙහි වැඩහිඳ මහණෙනි, මා එන්නට පූර්‍ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උන්නෙහිද?යි වදරා සිටිසේක්.

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඒ සා මහත් චණ්ඩ පරුෂ අන්ගුලිමාලයන් දමණය කර මහණකොට ඔහුගෙ ගුණය ලෝක ප්‍රසිද්ධ කොට වදළ පරිදි කථා කරමින් උන්සේකැයි දන්වූ කල්හි'' මහණෙනි, උතුම් වූ සම්‍යක් සම්බොධියට පැමිණි අවස්ථාවේ මොහු දමනය කිරීම පුදුමයක් කියා තොප සිතව්ද? පෙර මෙම සර්‍වඥතාඥනය පිණිස සසර ඇවිදිනෙම් ලෞකික ඥනයෙහි සිට මොහු දමනය වූ යේ මවේදැයි සර්‍වඥප්‍රවාරණයෙන් පවරා නොබැණ වැඩ උන්කල්හි ඒ අතීත කාලයෙහි අපට නොපෙනෙන භවයෙන් වැසුන කථා පුවත දැන ගන්නට කැමැත්තොමොයි දන්වා සිටිසේක.

''මහණෙනි, යටගිය දවස කුරුරට ඉදිපත් නුවර කොරව්‍ය නම් රජ කෙණෙකුන් දන ප්‍රිය වචන අර්‍ථචර්‍ය්‍යා සමානාත්මතා යයි දක්වන ලද සතර සංග්‍රහ වස්තුවෙන් සත්වයන්ගෙ සිත් ගෙණ රාජ්‍යය අනුශාසනා කරන්නාහුය. එකල පුරණ ලද පාරමිතා ධර්‍මයන් ඇති අප මහ බෝසතානො එරජහුගෙ අගමෙහෙසුන් බිසව කුස පිළිසිඳ උපන්හ. වෙදතය හා ලොකසමයාන්තරයන් ඇසීමෙහි සතුටු සිත් ඇති හෙයින් සුතසෝම කුමාරයෝ යයි නම් තිබූහ. ඉක්බිති සුතසෝම කුමාරයන් ශිල්ප ඉගෙනීම සඳහා තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට පත් කුඩයක්ද2, වහන්සගලක්ද, මසුරන් දහසක් ද දී යැවූහ. එසමයෙහි බරණැස කසී රජ්ජුරුවන්ගෙ පුත් වූ බ්‍රහ්මදත්ත කුමාරයෝද පියරජ්ජුරුවන් විසින් ශිල්ප උගන්නා පිණිස යවන ලදුව එම මාර්ගයටම එක්වූහ.

එකල්හි සුතසෝම කුමාරයෝ සියක් යොදුන් මගගෙවා ගොස් තක්සලා නුවර වාසල්දෙර ශාලාවෙක්හි සැතපී උන්හ. බ්‍රහ්මදත්ත කුමාරයෝද එසේ ගොස් එම ශාලාවෙහිම සැතපී උන්හ. මේ අතර සුවඳුක්

කථාවන් අතර ඔවුනොවුන්ගෙ මව්පිය තොරතුරුද දෙදෙනා දැන ගත්හ. දෙදෙනා පැමිණි කාරණා එක සමාන නිසා දෙදෙනාම එක ගුරුවරයෙකුගෙන් ගත මනා ශිල්ප ඉගෙන ගනිමුයි එකඟව ඇතුළු නුවරට වැද දිසාපාමොක් ආචාරීන් වෙත ගොස් අකායඞි ක්‍රියා රැගෙන ගිය ගුරු පඬුරු දී පා වැඳ ඉගෙනීමට පටන් ගත්හ.

එපමණක් නොව ඒ දඹදිව්තලෙහි විසූ එක්සියයක් රාජධානිවල රජකුමරුවන්ද අනෙකුත් කුමරවරුන්ද එම ආචාරීන්ගෙන් ශිල්ප උගෙනිති. ඔවුන් අතුරෙන් සුතසෝම කුමාරයො ඉගෙන ගන්නා ශිල්පය මැනවින් සිත්හි දරාගෙණ අන්සැමට පෙර ඉගෙන තම ප්‍රධාන මිත්‍ර බ්‍රහ්මදත්ත කුමාරයන්ට වහා ශිල්ප ඉගැන්වූහ. අවසෙශවූ කුමාරවරුනුත් ක්‍රමයෙන් උගන්වා නිමවූහ. මෙසේ ඒ එක්සියයක් රාජකුමාරවරුහු අදළ තැන් වනපොත් කොටදී ආචාරීන් වැඳ සමුගෙණ සුතසෝම කුමාරයන් පිරිවරා නික්මුනාහ. ඉක්බිති සුතසෝම කුමාරයෝ උන් උන් රටට යන්නාහු මංසන්ධිවලදී සිට කුමාරවරුන්ට අවවාද කරන්නාහු තෙපි හැම තොප තොපගේ රාජ්‍යයෙහි පිහිටි කළ සාරපෝයෙ පෙහෙව පොහෝ දවස් ප්‍රාණවධ ආදිය නොකොට සතර සංග්‍රහ වස්තුවෙන් වියෝ නොව රජකරවයි අවවාදු දුන්හ.

එක්සියයක් රාජකුමාරවරුම යහපත ආචාරීන් වහන්සැයි මුදනෙන් පිළිගහ. බෝධිසත්වයෝද අංග ලක්ෂණ දැන්මෙහි දක්ෂ හෙයින් මතු බරණැස් කුමාරයන් පිණිස දඹදිවට අනතුරක් උපදනේයයි දැන උන් උදෙසාම ඒ ඒ කුමාරවරුන්ට අනුශාසනා කොට යවුසේකයි දතයුතු එකල එක්සියයක් රාජකුමාරවරහු තම තමන්ගෙ රටට ගොස් පියරජවරුන්ට ශිල්ප දක්වා රාජ්‍යයෙහි පිහිටා තමන්ට කළ අවවාදයෙහි පිහිටා රාජ්‍යකරණ බවද දක්වා පඬුරු සමග සුතසෝම රජ්ජුරුවන්ට සන්දේශ යවූහ. බෝධිසත්වයන් වහන්සේද නැවත දන්වා යවනුයෙ අපගෙ අවවාදය නිතර සිහි කරව්, පිළිපදිව් රජදරුවන්ට නැවත දන්වා යවන සේක.

එයින් බෝධිසත්වයන්ගෙ අතිවිශ්වාසි වූ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මස් නැතිව බත් අනුභව නොකරන්නාහ. පෝය දවසට පෙරදවස්ම මස්ගෙණවුත් මුළුතැන්ගෙයි තබන්නාහ. එක්දවසක් පොහොය දවසට ගැනීමට තිබුන මස් අරක්කැමියාගෙ ප්‍රමාදයක් බලා රජගෙයි බල්ලො කා දැමීය. අරක්කැමි මස් නොදැක කම්පාව රන්මිටක් ගෙණ මස්සොයා ඇවිද එය තොලදින් මස් මාලු නැතිව බත් තිබ්බොත් මාගෙ ජීවිතය නැතැයි බියට පත්ව කිසිවෙකුටත් නොදැනෙන ලෙසට සොහොනට ගොස් එදම ගෙනත් තිබුණු මිණියක කලවා කපා ගෙනවුත් රසට උයා තැබීය. රජතුමාර ආහාර අනුභවයට ගෙණ මස් කැබැල්ලක් කටට ගෙණ කෑමට ගත්වේලෙහි වෙනද නොමැති අමුතුම රසයක් දැනී ඉතා සතුටට පත්වූයේය. ඊට හේතුව නම් මෙයට පෙර ආත්මභාවයෙහිදි යක්ෂව ඉපිද බොහෝ මිනිමස් අනුභව කළාහුය. මෙසේ පූර්වජාතිය කරණ ලද මාංශ භක්ෂණය හේතුකොට ගෙණ එරජහට මිනීමස් රසවත් විය.

ඉක්බිති ඒ රජ්ජුරුවෝ මුවෙන් නොබැණ මේ අනුභව කලෙම් නම් මේ මස්වූ පරිදි මට නොකියති යන්නක් සිතා කෙළ සමග කාරා බිමට දැමූහ. ඉක්බිති අරක්කැමියා විසින් මහරජ නිර්දෝෂය සැක නොවී මේ නිමවා වදළ මැනවායි කී කල්හි රජතුමා සමීපයෙහි සිටි මිනිසුන් ඉවත්කොට මේ මස් යහපත් බව දනිමි. මේ මොන මසක්දැයි විචාළහ. ඉක්බිති අරක්කැමියන්නේ ස්වාමීනි ඊයෙ දවස මේ මැරූ මස්මයයි කීය. එසේ නම් මෙතෙක් දවසක් මෙවන් රසක් නොතිබුනේ යයි විචාළහ. මහරජතුමනි අද වෙනත් ආකාරයට පිසපු නිසා මෙවන් රසයක් තිබෙන්නේ යයි කීය. වෙනදත් තොප මේයාකාරයට නොවේද පිසන්නේ තෝ ඇත්ත නොකීවොත් තොගෙ ජීවිත ආසාව අතහරවයි කීපසු, තත්වූ පරිද්දෙන් නොවලහාකීහ. එවිට රජතුමා මෙය කිසිවෙකුටත් නොකියවයි කියා මින්පසු වෙනත් මස් නැතිව මිනීමස් පමණක් ආහාරයට තබවයි කීහ. මහරජ මිනීමස් ලද නොහැකියි කීය. රජව සිටි අපට ලැබීම අපහසු නැත සිරගෙවල්වල බොහෝ මිනිසුන් ඇත. දවසට එකාබැගින් මරාමස් ගනුවයි

කීය. එතැන් පටන් දවසට එකා බැගින් මාර මස් පිඬිසස ලබා ගන්නේය. මෙසේ කල්යාමෙන් සිර ගෙවල් හිස්ව ගිය කල්හි දැන් කුමක් කරන්නේදැයි ඇසීය. අතරමග දහසින් බඳ පියලි එලා යමෙක් එය ගත්තා නම් ඔහු හොරෙක් ලෙස අල්වා ගෙණ මරාලවයි කියා ඒ ක්‍රමයෙනුත් මිනිසුන් මරණබැව් දැනගත් පසු කිසිවෙක් එම දහසින් බැඳි පියලි අල්ලන්නේවත් නැතිව ගිය පසු දැන් කුමක් කරම්දැයි ඇසූපසු

සවස තම තම රාජකාරි කටයුතු නිමකර මිනිසුන් වීදි ආදියෙහි නොගැවසෙන වේලාවලදී අහුමුළුවල සැඟව සිට යන එවුන් මරා මස් පිසවයි කීහ. එයාකාරයට කරණ ලද අවශ්‍ය මස් කොටස් ගෙණ සෙසු කොටස් එම ස්ථානවලම දමා යන විට මේ බැව් දැනගත් මනුෂ්‍යයෝ, මෙය සතුන්ගේ වැඩක්වත්, තරහ අමනාපකාරයින්ගෙ වැඩක් වත් නොව කවුරුන් හෝ මිනිසුන් මරා මස් කන කෙනෙකුගෙ වැඩක් බැව් දැන රජමාලිගාවට එක් රොක්ව ඝෝෂා කළහ. එවිට රජතුමා මේ කිමෙක්දැයි ඇසූ විට සියළුම මනුෂ්‍යයෝ ''ස්වාමීනි මෙනුවර මිනීමස් කන මිනී මරන සොරෙක් ඇත. වහා පරීක්ෂා කොට ඔහු ඇල්ලුව මැනවයි කී කල්හි කිමෙක්ද? මම කෙසේ නුවර පරීක්ෂා කොට ඇවිදිම්දැයි කී කල්හි, රජතුමාට මේ ගැණ කිසිම උවමනාවක් නැති බැව් දැනගත් රටවැසියෝ මහත් බියට පත්ව සිටිනු දුටු

කාලහස්ති නම් සෙනෙවි රජුන් කරා ගොස් ''ස්වාමීනි, මෙනුවර නොකටයුත්තක් පහළ විය. වහා සොරුන් ඇල්ලුව මැනවයි කීහ. ඉක්බිති සෙනෙවිරදු එපවත් අසා කම්පාව සත්දවසින් මත්තෙහි හොරා අල්වා දෙමියි අස්වසා යවා තමන්ගෙ සහචරයන් කැඳවා එපවත් කියා තොපි සැවොම තැන් තැන්වල සැඟවී සිට හොරා අල්වා ගනුවයි කියා උපදෙස් දුන්නේය. එතැන් පටන් ඔවුන් සැකමුසු ස්ථානවල රැක වලෙහි දිවා රාත්‍රියෙහි නිරත වූහ.

එකල්හි අරක්කැමි එක් වීදියක මුල්ලක සැඟවී සිට එක් ස්ත්‍රියක් කඩුවෙන් කපා මරා අවශ්‍ය මස් කොටස් පෙට්ටියක අසුරන්ට වූහ. ඉක්බිති

රැකවලෙහි යෙදී සිටි පුරුෂයො මොහු දැක අල්වාගෙන දෑත් බැඳ නුවර පුරා ප්‍රසිද්ධ කළහ. ඉන්පසු කාලහස්ති නම් සෙනෙවිරදූ අරක්කැමියා හැඳින කම්පාව ''මෝඩ තිරිසන් පවුකාරය, මෙයාකාරයට මේ ස්ත්‍රී පුරුෂයන් මරන්නේ හෝ මේ මස් අනුභව කරන්නෙහිද? එසේ නොමැතිනම් මේ මස් වෙනත් මස් සමග මිශ්‍ර කොට දී මුදල් උපයන්නෙහිද? යි විමසීය.'' නැත ස්වාමීනි, වෙන කෙනෙකුගෙ අවශ්‍යතාවයට මෙසෙ කරන්නෙමි, යි කීවේය. මෙවැනි දරුණු ක්‍රියාවක් කුමක් සඳහා කෙරේද? යි විමසීය.

ඉක්බිති අරක්කැමියා පාපෝච්ඡාරණය කරන්නේ, ''ස්වාමීනි, මම මෙසේ කරන්නේ මගෙ අවශ්‍යකමකටවත් මගෙ දරු පවුල් නඩත්තුව පිණිසවත් නොව, ජගත් පාලන නුඹවහන්සේගෙ මේ රජ්ජුරුවන්ගෙ මිනීමස් අනුභව කරන්නාහුය. ඒ සඳහා මා ලවා මෙසේ මිනී මරවන්නේය, යි කීය.

එපවත් අසා සෙනෙවිරද්දු මොහු විසින් මේ වචනය ඇත්තක් වශයෙන් කීයේද? නොඑසේ නම් මරණභයින් බොරු කීයේදෝ හෝයි විමසනු පිණිස අරක්කැමියාට තෝ භක්ති ස්වාමී වූ රජ්ජුරුවන්ගෙ මෙහෙවරින් මිනී මරන්නෙහි නම් හෙට උදෑසනම අන්තඃපුරයට ගෙන ගොස් රජ්ජුරුවන් ඉදිරියෙ ඇසූ කල්හි, අරක්කැමි පවසනුයේ ''සෙනෙවිරත්තුමනි, ඔබ වහන්සේට වඩ වඩා යහපතක් වේවා, ඔබ තුමා මා කැටුව මහරජතුමා වෙත ගියේ නම් මම නොබියව සියළු පුවත් කියමි,යි කීහ. සෙනෙවිරත්තුමා මොහුගෙ එඩිතර ප්‍රකාශය අසා දෑත් දෙපා බැඳ තිබූ ආකාරයටම එසේම තබා පහන් වූ කල සෙසු අමාත්‍යයෝද නුවර වැසියන්ද එකතු කර එකම තීරණයකට එළඹ නුවර සෑම තැනම රැකවල් තබා, නුවර පාලන බලය තමන් අතට ගෙණ අරක්කැමියාගෙ බෙල්ලේ මස්පැසය එල්වා රජගෙට ගෙණැයන්ට පිටත් වූහ. සියළු නුවරවාසීන්ද ඒකනාදීන් සෙනෙවිරත් පසුපස ගියහ.

රජතුමාද රෑ ආහාර නොමැතිව බඩසායින් සිට අරක්කැමි දූත් දූත්

එයි යන බලාපොරොත්තුවෙන්ම සිට මධ්‍යම රාත්‍රිය ගෙවී ගිය පසුව නිදන්ට උත්සාහ ගත්තත් නින්දද නැතිව පසුද අලුයම් වේලෙහි සී මැදුර කවුළුවෙන් පිටත බලන්නේ අරක්කැමියා රැගෙන එන පිරිස දැක මෙතෙක් අප කළ ක්‍රියාව එළිවී යයි භයපත්ව නැවත රාජ්‍ය ධෛර්‍යය උපදවාගෙණ රාජාසන මස්තකයෙ ගොසින් උන්හ. එකල්හි සෙනෙවිරත් රජු කරා එළඹ කියන්නාහු මහරජ නුඹ වහන්සේ අරක්කැමියා ලවා ස්ත්‍රී පුරුෂයන් මරා මස් කන්නේ සැබෑදැයි විචාළහ.

ඉක්බිති මහත්වූ තේජස් ඇති සෙනෙවිරදුන් විචාළ වචන සඟවාකිය නොහැකිව සැබෑය සෙනෙවිරත්නි මා කීවා කළ තැනැත්තහු අල්වාගෙණ හා සතුරන්ට කාරණ කවරේද තොපි සැපත් වුවොතින් සොරකු නොවෙද අල්වා පුව මැනවයි භය ගන්වා කීහ. එපවත් අසා සෙනෙවිරද්දු රජ තමාගේ මුඛයෙහිම නොසඟවා කීය. මොහුගේ සහාය ක්‍රියාව ඉතා ආශ්චර්‍යය මොහුවලකා අවවාදයක් ගෙණහැර දක්වමියි මහරජ නොකළ හැක්ක මිනීමස් කෑමෙන් වැළකුව මැනවයි කීහ. සෙනෙවිරත්නි, මට මිනී මස් කෑමෙන් වැළකිය නොහැක. එසේනම් රජතුමනි, නුඹ වහන්සේගෙ රාජ්‍යයෙන් හෝ ජීවිතයෙන් පලක් නොවන සේකයි කීහ. එසේ නමුත් මිනීමස් කෑමෙන් මට වැලකිය නොහැක. එපවත් අසා සෙනෙවිරද්දු රජතුමා සන්හිඳුවා ගත නොහැකැයි සිතා කථාවක් ගෙණහැර දක්වන්නහු.

මහරජ යට ගිය දවස මහා සමුද්‍රයෙහි මහා මත්ස්‍යයෝ භය දෙනෙක් වූහ. උන් අතුරෙන් ආනන්දය තිමින්දය අජ්ඣාරොහය යන මත්සු තුන්දෙනා පන්සියයක් පන්සියයක් යොදුන් දිගඇත්තාහ. තිමිය, තිමිංගලය, තිමිරපිංගලයයි යන මස්සු තුන්දෙනා දහක් දහක් යොදුන් දිග ඇත්තාහ. මෙම මස්සු සාගරයේ තිබෙන කඳු ශිකර තැනිතලා ආදියෙහි වැවෙන පාසි දිය සෙවෙල් ආහාර වශයෙන් ගෙණ ජීවත්වන්නාහ. මොවුන් අතුරෙන් පන්සියයක් යොදුන් දිග ඇති ආනන්ද නම් මත්ස්‍ය රජතෙම සමුද්‍රයෙහි එක් ප්‍රදේශයක වෙසෙයි. ඔහු දැකීම පිණිස බොහෝ

මත්ස්‍යයෝ එක්වන්නාහුය. එක් දවසක් ඒ මත්ස්‍යජාතිහු එක්ව කථා කරන්නාහු මේ සත්ව ලෝකයෙහි සියලු දෙපා, සතරපාද ජාතීන්ට රජදරුවෝ යයි කියා නැත්තාහ. මීට පළමු අපට රජ කෙනෙක් ඇත්තාහ. අපිදු අපට රජ කෙනෙකුන් ඇතිකොට වසම්හ. හැමදෙනා ආනන්ද නම් මත්ස්‍යයා රජකමට පත්කර ගත්හ.

එක් දවසක් ආනන්ද මත්ස්‍ය රජතෙම පර්වතයෙහි ගල් සෙවෙල් අනුභව කරන්නේ සෙවෙල් කඳයයි යන සංඥාවෙන් නොදැක කුඩා මස්සකු සපාකෑහ. එක්ෂණයෙහි ඔහුගෙ ශරීරය පිණා ගියේය. ඒක මාගෙ මේ මධුර රසකැයි බැලිය යුතුයයි සිතා මුඛයෙන් එළියට ගෙන බලන්නේ මාලු කැබලි බව දැක, මම මෙතෙක් කල් නොදැන මෙතරම් රසවත් ආහාරයක් අනුභව නොකෙරෙමි. අද පටන් මට මසුන් උපස්ථානයට ආකල මත්ස්‍යයො එකෙක්, දෙන්නෙක් ආදී වශයෙන් රහසින් අල්ලා අනුභව කරමියි සිතා නැවත සිතන්නේ එසෙ කලොත් උන් මා සමීපයට නොඑන නිසා උපස්ථානකර ආපසු යන උන්ගෙන් පසුපස යන්නාවූ මත්ස්‍යයන් නිසොල්මනේ අල්ලා කා පියමියි සිතා සිතූ ආකාරයටම ඇප උපස්ථානයට පැමිණ ආපසු යන මත්ස්‍යයන්ගෙන් කිහිප දෙනා බැගින් ගිල දමන්නේය.

මෙසේ කල්යාමේදී මත්ස්‍යයො අඩුවන්ට ගත් කල්හි ඔවුනොවුන් කථා කරන්නේ අපෙ ඥාති සංහතිය මෙසේ අඩුවන්නේ මොකක් හෝ අභිරහසක් ඇති නිසයි අප සැවොම මින්පසු විමසිල්ලෙන් සිටිය යුතු යයි සාකච්ඡා කරගෙන ආනන්ද නම් මත්ස්‍ය රාජයා ගැන සෝදිසියෙන් මත්ස්‍යයන්ට ඔහුගේ මෙම පහත් ක්‍රියාව අල්ලා ගැනීමට හැකිවිය. ඉන්පසු ඔහුකරා එකද මත්ස්‍යකුද නොපැමිණියේය.

එතැන් පටන් ඒ ආනන්ද නම් මත්ස්‍යරාජතෙම ඔස්රස ලෝභයෙන් වෙනත් ගොදුරක් අනුභව නොකරන්නේය. සයින් පීඩාව වෙහෙස විඳිමින් මත්ස්‍ය සමූහය මා හැර කොහේට ගියේදැයි තැන්තැන්වල බලා ඇවිදිනේ මුහුද මැද එක්තරා ප්‍රමාණයක පර්වතයක් දැක

ඒ මත්ස්‍යයෝ මා කෙරෙහි බියෙන් මේ පර්වතයෙහි සැඟවී සිටිතියි සිතා පර්වතය පරීක්ෂා කොට බලමියි සිතා, වාලධියෙන් සහ ඉසින් පර්වතය වටකොට ගත්කල්හි අනික් දිසාවෙන් වටකොට ගෙණ අවුදින් තමාගෙ හිස වෙතම පැමිණියාවූ තමාගෙම වළිගය දැක මේ මසකැයි සිතා මොහුම රැවටී හොඳ ගොදුරක් යයි සතුටුව කුසගිණි වැඩිකමට තමාගෙ වළිගයේ පණස් යොදුනක් දිගට හපා කැවේය. ඉක්බිති බලවත් දුක් වේදනාවට පත්ව මුහුදේ මුළු ප්‍රදේශයම එකම ලේ පාටට පත්විය. එම ඉවට අවට මුහුදේ සිටි වෙනත් මත්ස්‍යයො ඇදී එමින් එම ආනන්ද නම් මත්ස්‍ය රාජායාගෙ සියළු ශරීරයම කා දැමීය ශරීරය විශාල නිසා කිසි ආරක්ෂාවක් නැති විය. ඔළුව දක්වාම අනෙක් මත්ස්‍යයන්ගෙ ආහාරය බවට වැඩි වෙලාවක් නොගොස් පත්විය. බලවත් වේදනා විඳිමින්ම මලේය. යොදුන් පන්සියයක් දිග මත්ස්‍යයෙක් වූ නිසා ඇටකටු ගොඩ කඳු පර්වතයක් සේ විය.

එම ප්‍රදේශය හරහා ආකාශයෙන් ගමන් ගන්නා ධ්‍යානලාභි තපස්වරයෙක් මෙය දැක මනුෂ්‍යයන් අතර ප්‍රසිද්ධ කළේය. එම නිසා මහරජතුමනි, මනුෂ්‍යයන්ට අයිති ආහාර වෙනුවට රස තෘෂ්ණාවට පත්වූ ආනන්ද මත්වූ ආනන්ද මත්ස්‍ය රාජය තමගෙ මස්තමාම මරණයට පත්වූ ආකාරයට ඔබ වහන්සේත් මනුෂ්‍ය රජෙක් වෙලා මේ කරපු වැඩෙත් එම ක්‍රියාවත් සසඳා බලා අද පටන් මේ පුරුද්ද අත්හරින සේක්වා,යි ඉල්ලා සිටියහ.

එපවත් අසා රජතුමා කාලහස්තිනම් සෙනෙවිරත්නි, උපමා දන්නො නොපම නොවෙයි මමත් දනිමි කියා තමන් මිනීමස් කෑමෙහි ලොල් බැවින් වැලක්විය නොහැකි බැවින් සෙනෙවිරුහු ගිවිස්වන පිණිස උදහරණයක් ගෙණහැර දක්වන්නාහු සෙනෙවිරත්නි, යටගිය දවස සුජාත නම් කෙළෙඹිපුත්‍රයෙක් මහත් වූ සම්පතින් අඪ්‍යය එතෙම ලුණු ඇඹුල් සෙවීම පිණිස හිමාල වනයෙන් වැඩි පන්සියයක් තපස්වරයින් තමන්ගෙ උයනෙහි වස්වා උපස්ථාන කරන්නේය. ඔහුගෙ ගෙයි නිරන්තරව

පණවන ලද අසුන් දන් සැප වුවනම තිබෙන්නේය. එතකුදු වුවත් ඒ තපස් වීවරු කිසි දවසක බොහෝ දෙනාට කුසලානුග්‍රහ පිණිස දනව් සැරිසරා පින්ඩපාත චාරිකාවෙ යෙදෙති. ඇතැම් දවසක අහසින් හිමාල වනයට ගොස් දඹදිවට මායිම් වූ සියක් යොදුන් ඇති මහදඹ ගසින් මහදඹඵල ගෙනවුත් වළඳන්නාහුය, මෙසේ එක් දවසක් තපස්වීවරයන් දඹගෙණ වුත් වළඳන කල්හි සුජාත නම් සිටුදරු, ස්වාමි දරුවන් මාගෙ ගෙට නොවඩනේ ඇයිද?යි සෙවීම සඳහා තම දරුවාගේද ඇඟිල්ල අල්ලා ගෙණ ආරාමට ගියේය.

එකල්හි තාපසයෝ දඹ අනුභව කරමින් උන්හ. කෙළෙඹි පුත්‍රයාද තාපසවරුන් දැක වැඳ එකත් පස්ව හිඳ ස්වාමීනි වළඳන්නේ කුමක්දැයි විචාළේය. දඹයයි කී පසු කුඩා දරුවා දඹ ඉල්ලන්ට විය. එවිට දරුවාට දඹ දුන්පසු ඒවාකා රසවැටී නිතර නිතරම තම පියාගෙන් දඹ ඉල්ලන්ට ගත්හ. දරුවාගේ ඉල්ලීමෙ කරදරය වැඩි නිසා තාපසවරුන් වැඩසිටි ආරාමය කරා දරුවා සමග ගියවිට එම තපස්වරුන් බොහෝ කාලයක් මිනිස් පියසෙ සිටිනිසා නැවත හිමාල වනයටම ගියහ. ඉන්පසු තම පියා දන්නා දන්නා අග්‍ර පලවැල දුන්නත් ඒ කිසිවත් අනුභව නොකොට දවස් හතක් නිරාහාරව සිට මළේය. එසේ හෙයින් සෙනෙවිරදුනි, උතුම් රසයෙන් යුක්ත වූ මිනීමස් නොලදෙත් නම් මාගේ ජීවිතයට වන්නේත් ඒ ටිකමයයි කීවේ ය.

ඉක්බිති කාලහස්ති නම් සෙනෙවිරත් අතිශයින්ම මේ රජ තෘෂ්ණාවෙහි ගිජුවිය වෙනත් උදහරණයක් පෙන්වා බලමියි සිතා, මහරජ මිනීමස් කෑමෙහි නොවැලකි සේක් නම් මේ සා අමාත්‍ය මණ්ඩලයකින් සහ මේසා රාජ්‍යය ශ්‍රීයකින්ද පිරිහෙන සේකැයි අවවාද කරන්නාහු යටගිය දවස මෙම බරණැස් නුවර උපතින්ම පඤ්චශීලය රක්නාවූ උතුම්වූ සොත්ථිය නම් බමුණු කුලයෙක් ඇත්තේය. ඒ කුලයෙහි එක් පුතණුකෙනෙකුන් ඇති කල්හි ඒ කුමාරයා දෙමාපියන්ට ඉතා ප්‍රියව ව්‍යක්තය වෙදත්‍රය නිමවා දත්තේය. ඔහුගෙ සම වයසේ ඇති කුමාරවරුන්

සමග බොහෝ සෙයින් එක්ව සිටින්නේය. සෙසු කුමාරවරු රා මස් අනුභව කරන්නහුය මෙකුමරු එයින් වැලකී සිටින්නේය.

අනෙකුත් කුමාරයක් එක්ව කථා කරන්නේ මොහු අපෙ සමාජයට ගන්නම් කෙසේ හෝ මොහුටත් රා, මස් පුරුදු කළ යුතුයි නැතිනම් අපට මොහුගෙන් ප්‍රයෝජනයක් වන්නේ නැතැයි සිතා එක් උපක්‍රමයක් සකසා, සබඳ සැනකෙළි කෙලිම්හයි කීහ. එවිට සොත්ථිය කුමාරයො කියන්නාහු ඔබ සැම රා බී මස් කා සැණකෙළි කරන්නේ මම ඒවාට කැමති නැති නිසා ඔබලාගෙ කැමැත්තක් කරවයි කීය. එවිට ඔවුන් කියා සිටියෙ සබඳ ඔබගෙ පාය සඳහා කිරිගෙන්වා ගන්න අපගෙ මේ සුපුරුදු පානය අපි බලා ගන්නම් කියා කීවේය. ''කෙසේ හෝ මෙම අහිංසක කුමාරයා කෙළි සෙල්ලම් පිණිස පොළඹවා ගත්තේය. ඔවුන්ගෙ උපක්‍රමය අනුව නෙළුම් කොළවල ගොටු ගසා යටින් උරා බොන ආකාරයට සකස් කර තැබීය.

ඉක්බිති ක්‍රීඩාකර ගිමන් හරින වේලෙහි කුමාරයාට කිරි ගෙණෙන ලෙසත් අනෙක් කුමාරවරුන්ට පොකුරු මී ගෙණෙන ලෙසත් දන්වා සිටියේය. එසේ ගෙනෙන ලද පොකුරු මී ගොටුවල යට සිදුරපාද කට තියා බොන්ට වූහ. ඒ දුටු කුමාරයො මේ කිමෙක්දැයි අසා මේවා පොකුරු මී කී පසු එසේ නම් මටත් ඒ පොකුරු මී ගෙනෙන්නැයි ඉල්ලා සිටි පසු එසේ සකස් කර තිබූ රාගොටුවක් පිළිගැන්විය. සෙසු මිත්‍රයන් බොන ආකාරයට මෙම කුමරුවාද එය පානය කර අන්තයෙහි සුරාමතින් මත්ව පුළුස්සන ලද මස්ද දුන්හ. ඒවාද අනුභවය කර කුමාරයාට එය රසවැටුනු පසු සෙසු මිත්‍රයො මේ පොකුරු මී නොව රා යයි කීපසු රා මෙතරම් හොඳ දෙයක් බැව් මම මෙතෙක් දැන නොසිටියෙමියි කියමින් ඉන්පසු සෙසු මිත්‍රයන්ද අභිබවා රාමස්වලට ඇබ්බැහි විය.

රා සහ මස්වලට කොපමණ ඇබ්බැහි වීමක් උනාද කීවොත් අතේ කරේ තිබූ රත්‍රන් බඩු පවා දෙමින් ඒවා ඇබ්බැහි විය. අවසානයෙ ඇඟිල්ලේ තිබූ පේරුස් මුද්ද පවා දී රා ගෙන්වා බොන්ට ඇබ්බැහි විය. එක් දිනක් රා බී මත්ව ඇස් රතු කරගෙන ගෙදරට ගියපසු පියා එය දැන මත්

ගතිය සිඳෙනතුරු සිට අවවාද කළත් ඒ වනවිට අර අහිංසක කුමාරයා දෙමාපිය වරදින් පාප මිත්‍රයන්ට එකතු වී මුළු ජීවිතයම කාළකන්නි කරගෙන අවසානයෙ සිඟමන් යදිමින් අගුපිල් ගැනේ ලගිමින් මහමගම ජීවිතය නිම කළේය. සෙනෙවිරද්දු මෙම කාරණය ගෙනහැර දක්වා මහ රජතුමනි ඔබ වහන්සේ මෙය ආදර්ශයට ගෙන ජීවිතය ගෙවන්න රස තෘෂ්ණාවට වහල් නොවන්න, නොඑසේ නම් ඔබ තුමාටත් එකී කුමාරයාට වූ දෙයම වන්නේ යයි කීවේය.

මෙයාකාරයට දෙදෙනාම තව තව උපමා කථා කියමින් සිටියාය. (ඒවා දැනගත යුතු පින්වතුන් වෙතොත් පන්සිය පනස් ජාතක පොත් වහන්සේ කියවා තේරුම් ගන්න.)

එම උපමාවන් හේතුවෙන්ද රජතුමාගෙ කෑදර සිත පාලනය කර ගැනීමට නොහැකි වූ තැන සෙනෙවිරත්තෙම රජු කෙරෙහි අනුකම්පාවෙන් ඔහුට වන විපත පෙනෙන නිසා තවත් උත්සාහයක් වශයෙන්, රජතුමාගෙ කුමාරවරුන්ද, අන්තඃපුර ස්ත්‍රීන්ද, සොළොස් දහසක් බිසෝවරුන්ද, සර්වාලංකාරයෙන් සරසා ගෙණවුත් රජතුමාට පා මහරජ නුඹ වහන්සේගෙ නෑ ජනයාද, පිරිවරා සිටි ඇමති මණ්ඩලයද, මෙබඳු වූ රාජ්‍ය ශ්‍රීයක් බලා වදළ මැනවයි, රජ්ජුරුවෙනි නිකම් අනාථයේ නොනැසී මිනීමස් කෑමෙන් වැලකුන මැනවයි කීහ.

ඉක්බිති රජතුමා පවසනුයේ මේ සියළු රාජසම්පත්තියට වඩා මිනී මස් කෑම උතුම් බවයි. එපවත් අසා සෙනෙවිරද්දු, එසේනම් මෙනුවරින්ද රටින්ද පිටවන්නැයි කීහ. එවිට රජතුමා සෙනෙවිරත්නි, මට රාජ්‍ය සම්පතින් ප්‍රයෝජන නැත. රටින් නික්මෙන මට කඩුවත් අරක්කැමියත් පමණක් දීපිය වූ කීහ. ඔහුගෙ ඉල්ලීම අනුව කඩුවකුත්, මිනීමස් පිසන්ට හැළියකුත්, අරක්කැමියාත් දී රටින් පිටකළහ.

රජතුමාද අරක්කැමියා සමග රටින් නික්ම වනයකට වැද එක් නුගරුකක්මුල වසන්නාහු අවට මාර්ගයෙහි සිට මිනිසුන් මරා අරක්කැමියාට ගෙනවුත් දෙන්නාහ. ඔහු මිනී මස් පිස රජ්ජුරුවන්ට

දෙන්නේය. මෙසේ ඔවුන් දෙදෙන ජීවත් වන්නාහුය. මිනිසුන් එක් රොක්වන තැන් බලා දුවගොස් කඩුව හිසවටා කර කවා මමයි පෝරිසාදයා කියා භයානක ශබ්දයක් නිකුත් කරන්නේය. එම ශබ්දය අසන මනුෂ්‍යයො හියෙන් භ්‍රාන්තව සිහිසන් නැතිව සිටින ස්ථානයෙහිම බිම ඇද වැටෙන්නේය. එවිට එයින් තමාට කැමති මස් තිබෙන මිනිසකු මරා අවශ්‍ය කොටස් කපා ගෙනවිත් කෝකියාට දෙන්නේය.

වැඩි දවසක් නොගොස් මෙම පුවත දඹදිව පුරා පෝරිසාද නමින් දරුණු සොරෙකු මිනීමරා මිනීමස් කන්නේයයි පැතිර ගියේ. එය ඇසූ මනුෂ්‍යයො එම සොරු සිටින ඉසව්වකටවත් නොයන්නේය. ඒ අනුව දෙදිනක් මිනිස් දඩයම් නොලැබ කුස ගින්නේ පැමිණ අරක්කැමියාට කියන්නේ ලිප ගිනිදල්වයි කියා එපවත් ඇසූ අරක්කැමි කියන්නේ මස් කොයින්ද?යි ඇසීය. මස් දූන් දූන් ලැබෙතයි කියා කීවිට අරක්කැමියා දූන් ඉතින් මාගෙ ජීවිතය ඉවරයි සිතා ගිනි මොලවා වතුර සැළිය තැබුවාත් සමගම අරක්කැමියා දෙපලුකර එම වතුර සැලියේම තම්බා කා ඉන්පසු තමා හුදකලා විය.

එකල්හි මහත් සම්පත් ඇති බමුණෙක් ගැල් පන්සියයක් පුරවාගෙන වෙළඳාම කරනුයේ නැගෙහිරින් බටහිරට යනුයෙ, පොරිසාදයාගෙ උපද්‍රව අසා එහි සිටි මනුෂ්‍යයන්ට දහසක් වස්තුවදී මේ මිනීමරු සොරාගෙන් මා ආරක්ෂා කරදෙන්නැයි ගිවිසගෙණ එම මනුෂ්‍යයන් සමග ගමන පටන් ගත්තේය. මෙසේ යන අතර පෝරිසාදයාද ගසක් උඩට නැග යන එන්නවුන් සෝදිසියෙන් සිටියේ, ගැල්සාත්තුයෙහි එනවුන් දැක ඒ එන මිනිසුන් අතුරෙන් බමුණාගෙ මස්ම කමියි සිතාගෙණ කෙළ ගිලිමින් සිටියේය.

තමන්ගෙ ඉලක්කයට එම ගැල් සමීප වූ පසු ගසින් බැස භයන්කාර ශබ්දයෙන් එම්බල මාගෙ ගොදුරු මත්ස්‍යයෙනි මමයි පෝරිසාදයා කියා කඩුව ඉසවටා කරකවා පුසැනෙන් දඩයම් කරුවෙකු දුටු මුවරැලක් හිස්ලු ලූඅත දිව ගියත් මොවුන් එකෙකුටවත් දෙපා ඔසවන්ට

ශක්තියක් නැතිව හියෙන් ත්‍රාන්ත්‍රව එහිම වැද වැටුනේය. එවිට පෝරිසාදයා වහා බමුණා කරපිට තබාගෙණ දිවයන්නේ, ටික වේලාවකින් සිහිය ලැබ නැගී සිටි මනුෂ්‍යයෝ බමුණා නොදක මිත්‍රවරුණි අපි බමුණාගෙ ආරක්ෂාව පිණිස ඔහුගෙන් ධනය ගෙණ ඔහු අතරමං කර දමා පලා යාම අපට නින්දවක් වන්නේය. එමනිසා අපගෙ පිරිමිකමට නිගාවක් නොදී බමුණා බේරා ගැනීමට හැකිවෙවා, බැරිවේවා අපේ පණ බේරාගෙණ තීවයන් සේ නොගොස් හොරා අල්ලාගන්න උත්සාහ කරමුයයි කථා කොට පා සලකුණෙන් හොරා ගිය මග ඔස්සේ ලුහුබඳින්ට වූහ.

පෝරිසාදයාද යම්දුරක් දිවගොස් ආපසු බලා කිසිවෙකුත් පසුපස නොඑන බව දැන සෙමින් සෙමින් යන්ට වූහ. සොරා පසුපස ලුහුබඳින පිරිසෙන් එක් යෞවන පුරුෂයෙක් වේගයෙන් දිවගොස් හොරාට සමීප වූහ. සොරා තමා පසු පස එන මිනිසුන් දැන නැවතත් වේගය උපදවා දුවන්ට ගත් කල්හි ගසක් වැටී මාගීය අවහිරව තිබූ ස්ථානකින් පැනීමේදී වෙනත් කැඩී ගිය ගසක උලක් මත පය තැබී යටි පතුලෙන් ඇනුණු උල පිටිපල්ලෙන් පිටවිය. එසේද වුවත් අපහසුවෙන් නමුත් දුවන්ට විය. දැන් දැන් තමා පසුපස එන්නවුන් සමග සටන් කිරීමට ශක්තියක් නැති බැව් තේරුම් ගිය නිසා බමුණා බිම දමා පණ බේරා ගෙණ පලා ගියහ.

පසුපස හඹා ගිය පිරිසට බමුණා හමුවූ පසු සොරාගෙන් අපට කම් නැත අපගෙ යුතුකම අපි කළෙමුයි කියා බමුණාද රැගෙණ ආපසු ගියහ. පෝරිසාදයාද තමා වසන නුගමුලට පැමිණ අසරණව නුගරුකට ආරාධනා කරන්නේ ස්වාමීනි වෘක්ෂ දේවතාවෙනි, සත් දවසක් ඇතුළත මාගෙ පය වණය සුවකොට දුන්සේක් වීනම් සියලු ජම්බුද්වීපයෙහි රජදරුවන්ගෙ උගුරු කැපූ ලෙයින් මේ නුග කඳ සොධා උන්ගෙ බඩවැල් වලින් කඳවෙලා පඤ්ච මධුරමාංසයෙන් බිළි පූජාවන් දෙමියි අයැද ගත්හ.

ඔහු මෙසේ සත්දවසක් ආහාරයකින් නොමැතිකමින් ශරීරය වියලී කකුලේ වණය සුවවී ගියේය. එය මෙම වෘක්ෂයට අධිගෘහිත දෙවියන්ගෙ

ආනුභාවයෙන් සුවවුවා යයි සිතා සතුටු කීප දවසක් නැවත මිනීමස් කා කාය බලවඩා, මට බොහෝ උපකාර කළා වූ දේවතාවන්ට වූ භාරභාරයෙන් මිදුන මැනවයි සිතා කඩුව ගෙණ රජවරු දඩයමේ පිටත් වූහ.

ඉක්බිති පූර්ව ආත්මභාවයෙහි එක්ව මිනීමස් කා ඇවිදි මිත්‍ර යක්ෂයෙක් දැක මොහු පෙර ජාතියෙහි මා සමග මිනීමස් කා ඇවිදි මිත්‍රයායයි කියා ඇඳින, මිත්‍රය තෝ මා අඳුනන්නෙහිදැයි ඇසීය. මම තොප නොහඳුනමියි කීය. ඉක්බිති යක්ෂයා පෙර ජාතියෙහි කළ කටයුතු මතක් කර දුන්නේය. ඉන්පසු ඔවුන් දන හැඳින යක්ෂයා විසින් තොප කොයි උපනීදැයි විචාළ කල්හි කසීරට රජ කුලයෙහි ඉපද රාජ්‍යයෙහි පදස්ථව මිනීමස් කෑම නිසා රටින් පිටුවහල් කළ බවද මෙම නුගගස මුල වසන බවද කකුලේ උලක් ඇනී දෙවියන්ට කීපසු සුවකර දුන් බවත් ඒ වෙනුවෙන් දෙවියන්ට භාරභාරයක් සඳහා රජදරුවන් අල්ලන්ට යන බවත් තොපගේ සහාය අවශ්‍යබවත් කීවේය.

එවිට යක්ෂයා කියන්නේ මට වෙනත් කටයුත්තක් ඇත. එසේවුවත් මම තොපට වටිනා මන්ත්‍රයක් දෙමි. ඒ මන්ත්‍ර බලයෙන් තොපට කාය ශක්තිය ද, ජවයද, තේජසද, වඩන්නේයයි මන්ත්‍රයෙ බලය කීවේය. සොරාද එම මන්ත්‍රය ඉගෙන ගත්පසු යක්ෂයා තමාට අවශ්‍ය තැනට ගියේය.

පෝරිසාදයාද එම මන්ත්‍ර බලයෙන් මහත්වූ කාය ශක්ති සම්පන්නව අතිසූරව දින හතක් ඇතුළත එක්සියයක් රාජධානියෙහි රජවරුන් උයන් කෙළියට යන කල්හි පවනට බඳු වේගයෙන් දිවඅවුත්, මමයි පෝරිසාදයා යයි කියමින් හයගත්වා තමාගෙ කරපිට තබා පවනට බඳු වේගයෙන් නුගගස මුලට ගෙනත් දෙඅත් විද ලනු දමා මහපටඇඟිලි බිම ගෑවෙන සේ නුග ගසේ අතුවල එල්ලීය. ඒ රජදරුවන්ද ඉතා කොමල බැවිනුත් බිය වැඩි බැවිනුත් මලානිකව සුළඟට වැනෙන පරඬලා පත් සේ වැනෙන්නේය.

මේ අතර සුතසෝම රජ්ජුරුවන් බාලකල ශිල්ප ඉගැන්වූ පිට්ටි ආචාරීන් හෙයිනුත් දඹදිව රජදරුවන්ගෙන් හිස්නුහුව මැනවයි සිතා මේ කාරණා දෙක අපේක්ෂා කොට අල්වා නොගෙණායේය. මෙසේ සුතසෝම රජ්ජුරුවන් හැර එක්සියයක් රජවරුන් අල්වා ගස උඩ බැඳ එල්වා දේවතාවට වූ පොරොන්දුව සම්පූර්ණ කරමියි සිතා මහත් වූ දර සැයක් බැඳ ගිනිඅඟුරු බස්නා පිණිස මොලවා උලක් සකස් කරමින් උන්හ.

එම නුගගසට අධිගෘහිත දේවතාවා එපවත් දැන මොහු මා වෙනුවෙන් බිලියම් දෙමියි පටන් ගත්තේය. මා විසින් සුවකළ වණයකුත් නැත, මේසා මහත් විනාශයක් කරන්ට පටන් ගත්තේය. මෙය මට වැළැක්විය නොහැකයි දැන එම දිව්‍ය පුත්‍රයා සමගින්ම සක්දෙව් රජවෙත ගියහ. එය මටවත් වැලැක්විය නොහැක්කයි දැන එය වැළැක්වීමට සමර්‍ථ කෙනෙකුන් සොයනුයේ, කුරුරට ඉදිපත් නුවර ධනඤ්ජය කොරස රජ්ජුරුවන්ගෙ පුත් සුතසෝම රජ්ජුරුවන් හැර වෙනත් කිසිවෙක් නැත. ඒ සුතසෝම රජ්ජුරුවෝ පෝරිසාදයාත් දමනය කර එක්සියයක් රජදරුවන්ගෙ ජීවිතත් බේරාදී මුළු දඹදිවම ධර්‍මයෙන් අවදි කරන්නේයයි තොපගොස් සුතසෝම රජ්ජුරුවන් බිලියම් කළොත් විනා මම තොප නොපිළිගණිමියි කියා ලවයි කීය.

එවිට දේවතාවත් ශක්‍ර දෙවියන්ට වැඳ අවසර ගෙණ අවුත් තපස් වේශයකින් පෝරිසාදයාට නුදුරු තැන ඔහුට පෙණෙන ලෙස ගමන් කළේය. එකල්හි පෝරිසාදයෝ තාපසතුමන්ගෙ පාශබ්දයෙන් ආපසු හැරී බැලුයේ මහණ වේශයෙන් සිටි දේවතාවා දැක තපස්වරයො නමුත් රජවරුමය, එමනිසා මේ තාපසත් අල්ලා ගෙණ එක්සියයක් දෙනා සම්පූර්ණකොට බිලිපූජා කෙරෙමියි සිතා කඩුව ගෙණ තුන් යොත්තක් ලුහුබැඳත් අල්වා ගත නොහැකිව විඩාවට පත්ව මම මීට පෙර දුවන ඇතකු අශ්වයකු වුවත් අපහසුවක් නොමැතිව අල්ලා ගත්තෙමි. දැන් මේ පියවි ගමණින් යන්නාවූ තාපසයන් මහවේගයෙන් දිවත් අල්ලා ගත නොහැකිවීමි. ඊට හේතුව කුමක්දැයි සිතා ඉක්බිති තපස්වරයෝ නම් කීවක්ම කරති ඔහෙ හිටු කියා නවත්වා අල්ලා ගනිමියි සිතා සිටු මහණ

සිටු මහණ කියා කෑ ගැසීය.

ඒ අසා දේවතාවා මම සිටියෙමි තෝ සිටින්න උත්සාහ කරවයි කීවේය. එබස් අසා පොරිසාදයා එම්බල තපස්වරයො නම් ජීවිතය පිණිසවත් බොරු නොකියන්නාහුය. තමා විසින් සිටුවයි කියන ලද්දෙහි සිටි පැපියා නික්මුණෙහිය යන ගමන්ම සිටියෙමි කියන්නේය. මෙසේ වෙහෙසාකියන්ට මා අත තිබෙන මේ කඩුව කොසු මිටක් සේ සිතයිද? යි තපස්වීන් බියගැන්වූහ. ඉක්බිති දේවතාවා එම්බා පෝරිසාදයෙනි මම කුසල ධර්මයෙහි පිහිටි හෙයින් සිටියා නම් වෙමි. තොප සේනාමගොත්‍ර පෙරලී නමක් නොකෙරමි. පාණාතිපාතාදි අකුසල් කොට මෙයින් චුතව නරකයෙහි උපදනු තොපසෙවුවන් සිටි තෝ දතිනුත් සසරින් ගැලවීමක් නැති හෙයින් සිටියත් ඇවිදිනා නම් වෙයි. බුද්ධාදී වූ උත්තමයෝ කියන්නාහුය. ඉදින් මහරජ ඒකාන්තයෙන් බිලියම් කරණ කැමැත්තෝ නම් සුතසෝම රජ්ජුරුවන් ඇරගෙණවුත් බිලියම් කරව.

උන් එක්කොට ගෙණ බිලියම් කළානම් එක් සියයක් රජවරුන්ගෙ ගල ලොහිතාදියෙන් බිලියම් කෙරෙමි කී සත්‍ය වචනයෙන් හා බලි විධානයෝ සදිව්‍ය ලෝකයට පැමිණෙන්නා වේදැයි මෙසේ කියා දෙවතාවා තපස් වේශය අන්තර්ධාන කොට තමාගෙ දිව්‍ය වේශයෙන් නභෝ මණ්ඩල ගත සූර්‍ය මණ්ඩලය මෙන් දීප්තිමත්ව සිටියේය. පෝරිසාද තෙම දෙවතාවන්ගෙ කථා ස්වරූපයද දිව්‍ය වේශයද බලා තෙපි කවරුදැයි විචාළෝය. ඔහු විසින් මේ නුග ගස වසන දෙවතාවා නම් මමයයි යනු අසා මාගෙ දෙවතානන් සිය ඇසින් දුටිමියි සතුටුව සාමීවූ දිව්‍ය රාජයන් වහන්ස සුතසොම රජ්ජුරුවන් නොලබමි නොසිතා නුඹ වහන්සේගෙ විමානයට වන මැනවැයි කීවේය.

එවිට දේවතාවත් පෝරිසාදයා බල බලා සිටියදීම නුග ගසට වන්නේය. එම ඇසිල්ලෙහි ඉරන් බටුයේය, සඳත් නැංගේය, පෝරිසාදයාද වෙද වෙදංගයෙහි දක්ෂව නක්ෂත්‍රයෝග තමන් දන්නා හෙයින් අහස බලා ප්‍රස නැකත ලැබෙන්නේය. සුතසෝම රජ්ජුරුවෝ ජලස්නානය පිණිස උයනට යන තැනදී අල්වා ගණිමියි සියලු ජම්බුද්වීපවාසී වූ සත්වයෝ

තුන්යොක්තක් අවට රැකවල් ද සිටින හෙයින් බලවත් ආරක්ෂා ඇත්තේය. එනිසා උයනට රැකවල් සැලසෙන්ට පළමුකොට පෙරයම් දස පැය ඇතුළත මිගාරවීර නම් උයනට ගොස් මගුල් පොකුණට බැස සිටිමියි සිතා එපරිද්දෙන්ම ගාස් පොකුණට බැස නෙළුම් පතකින් ඉස වසාගෙණ සිටියේය.

ඒ පෝරිසාදයාගෙ ආනුභාවනේ පොකුණෙහි සිටි මස් කැස්බෑවෝ පසු බැස ගොස් දියයට සැඟව උන්හ. මෙසේ තිරශ්චිතයන් දක්වා භය ඇතිවන්ට පෝරිසාදයන්ගෙ ආනුභාවයක් කෙසේ පැමිණියේද? යත් පූර්වයෙහි කුසලානුභාවයෙන් පහළ වූයේ කෙසේදැයි යතහොත් ඒ පෝරිසාදයෝ පෙර කාශ්‍යප බුදුරජාණන් වහන්සේගෙ සමයෙහි බුදුපාමොක් භික්ෂු සංඝයාට කිරිපිඬු දන් දුන්හ. ඒ කුසලානුභාවයෙන් මහබල ඇති විය. ගෙවල් සාදවා භික්ෂු සංඝයා වහන්සේට සීත පීඩා දුරුකරණ පිණිස ගිනිකබල්ද දරපලන වැ පොරෝ ආදිය දන් දුන්නේය. එකුසල බලයෙන් තේජස් ඇතිවූයේය. මෙබඳු වූ කුසල බලයෙන් තේජස් ඇතිවූයේය.

සුතසෝම රජ්ජුරුවන් උයනට යන්ට පැමිණි කල්හි පහන්වන්ට පූර්ව භාගයෙහිම තුන් යොදුනක් අවට රැකවල් ගත්තාහුය. ඉක්බිති සුතසෝම රජ්ජුරුවෝත් පෙරවරු බත් නිමවා සර්වාභරණයෙන් විභූෂිතව මගුලැතු නැගී සිවුරඟ සෙනඟ පිරිවරා උයනට යන්ට නුවරින් පිටත් වූයේ එකෙණෙහි තක්සලා නුවරින් බමුණු කෙනෙක් ගාථා සතරක් ඇරගෙණ එක්සිය විසි යොත්නක් මග ගෙවා අවුත් නුවරට ආසන්නයෙහි ගමක ලැග දෙවනද ඉරනැගි වේලෙහි නුවරට වදනේ නැගෙනහිර වාසලින් පිටත් වූ රජ්ජුරුවන් දැක දකුණත ඔසවා ජයතු භවං මහාරාජ යනාදීන් ආශිර්වාද කළේය. රජතුමා එය දැක බමුණා සමීපයට ගොස් ඔබ කොයි රටේද මෙතනට ආවේ කුමක් පිණිසද?යි මගෙන් කුමක් අවශ්‍යදැයි විචාළහ.

එබස් ඇසූ බමුණුතුමා දේවයන් වහන්ස, ඉතා දුර සිට පැමිණියෙමි. අර්ථ ඇති හෙයින් සාගරය සමාන වූ භාග්‍යවත් අර්හත් කාශ්‍යප සර්වඥයන් වහන්සෙ විසින් වදරණ ලද සතාරහ ගාථාවන්

සතරදෙන ඔබ වහන්සේ සුභාෂිත ඇසීමෙහි අභිප්‍රාය ඇතැයි යනු අසා හැරගෙණ ආවෙමි. මෙලොව පරලොව දෙකින් අභිවෘද්ධි කරන්ට නිසි මධුර වූ අර්ථඇති ගාථාවන් අසව මහරජයි කීවේය. එඅසා රජතුමා සතුටුව ආචාරිණි තොප කලදෑ ඉතා යහපත උයනට ගොස් ඵුස්ස යෝගයෙන් ජලස්නානය කොට අක්ල ඒ ගාථාවන් අසමියි කීය. නැවත ඒ බමුණාට කළමනා සියලු වත් පිළිවෙත් කරණ ලෙස දන්වා උයනට වන්නාහ.

එම උද්‍යානයත් අටලොස්රියන් උස පවුරෙන් වටකරණ ලද්දේය. එබඳු වූ පවුරෙන් පිටත චතුරාන්ගිනි සේනාව ආරක්ෂාව පිණිස සිටියහ. එම ආරක්ෂාවන් මධ්‍යයෙහි සුතසෝම රජතුමා පොකුණට බැස ජලස්නානය කොට ගොඩට පැමිණි වේලෙ රාජපුරුෂයන් නැවත රාජාභරණ සළු පිළිවලින් සැරසීමට සූදනම් වූ වේලේ සිදුවූ සියල්ල බලාසිටි පෝරිසාදයා මෙසේ සිතීය. රජතුමා මෙලෙස සරසන්ට වුවොත් මට බැර වැඩි වෙන නිසා මෙම සැහැල්ලු වස්ත්‍රය පිටින්ම ගෙන යා යුතුයයි සිතා දිය දෙබෑකොට මහත් බියකරු ශබ්දයෙන් මමයි පෝරිසාදයා කියා එක්විටම රජතුමා කරපිටට ගෙණ කඩුව අමෝරා සියළුම චතුරාන්ගිනි සේනාව භයින් සිහිමුර්චා කරවා ඇතුන්, අසුන්, රිය උඩින් රියයක් පෙරළමින් පලා ගියහ. එසේ යොදුන් තුනක් පමණ දුර ගොස් පසු පස එන්නෙකු ඇත්දැයි බලා කිසිවෙක් නැති නිසා සෙමෙන් සෙමෙන් යන්නට වූහ.

මේ අතර සුතසෝම රජතුමාගෙ හිසේ කෙස් වැටියෙන් බේරෙන වතුර පෝරිසාදයාගෙ ඇගෙ වැටෙන විට අනේ මේ රජ්පුරුවෝ මරණ බයින් අඬන සැටියයි සිතා, ''මහරජතුමනි, නුඹ වහන්සේ වැනි ප්‍රඥ බහුල ඇසූ පිරූතැන් ඇති ස්ථානොචිත ප්‍රඥ ඇති රජ කෙනෙක් අඬන්නේ අඹු දරුවන් සිහිපත් වෙලාද? රාජ්‍ය සම්පත් අහිමිවන නිසාද? තොපගෙ ජීවිතයට වන විනාශය සිහිපත් වෙලාද? තොපවන් බුද්ධිමතුන් මෙසේ භයින් ත්‍රස්තව හඬන කල පෘතග්ජනයන් ගැන කවර කථාද? තොපගෙ ඇඬීමට හේතුව මට කියවයි කීය.

එපවත් ඇසූ රජතුමාමමද සිලු සංස්කාරධර්මයන් අනිත්‍ය සේ දක්නෙමි මා පිණිස වේවයි පුත්‍රදරාධින් පිණිස වේවයි ධන සම්පත් වෙනුවෙන් වේවයි රාජ්‍යය පිණිස වේවයි ශෝක කරන්නෙක් නොවෙමි. මම උයනට ඇතුළු වන අවස්ථාවේ බොහෝ දුර සිට පැමිණි බමුණෙක් හට මම යම්කිසි ප්‍රතිඥාවක් දී ආවෙමි. එනම් ආපසු එන ගමනේදී ඔබ හමු වී එම ගාථා හතරෙහි අර්ථය අසමියි කියා එම ප්‍රතිඥාව ඉෂ්ට කිරීමට නොහැකිවීම පොරොන්දු කඩකිරීමක් නිසා කණගාටු වනවා මිසක් මම වගුරණ කඳුළක් නැත. තොප මම මදකට හැරපීම් නම් මාගේ සබා බසට කැලලක් නොකොට ගොස් ඔහුගෙ ධර්ම දේශනා අසා සත්කාර කොට නැවත තොප කරා එමියි වදළ සේක.

එපවත් අසා පෝරසාද තොමො කොරවප ශ්‍රේෂ්ඨ වූ රජතුමනි තෙපි මා බඳු වූ මිනීමරන්නා වූ සොරෙක් වෙතින් ගැලවී සිය නුවරට ගොස් අතිමධුර වූ ජීවිතය නැවත ලදින් ප්‍රණීත වූ ජීවිතය පඤ්චකාම සැප කැමති තෙපි පසමිතුරු වූ මා සමීපයට කෙසේ නම් එවුද තොප කියන වචනය විශ්වාස නොකරමියි කීයේය. එපවත් අසා ශ්‍රී මහා බෝධි සත්වයෝ එම්බල පෝරිසාදය පාණාතිපාතිදි වූ පව්වු ගුණයම ස්වභාව ධර්මයකොට වාසය කරන්නා වූ හීන ජාතීන්ගේ ජීවත්වීමට වඩා පිරිසිදු සීලයෙහි සිට මියන මරණ උතුමැයි මා ඇතුළු සියලු සත්වයන්ගෙ බස එබැවින් සබඳ මම ජීවිතය පිණිස බොරු කියන එකෙකිම් නොවෙමියි කියා, නැවත තමන් වහන්සේගෙ සතිරත්වය වදරණ ලද්දවූ බෝධි සත්වයෝ මාගෙ වචනයේ බොරුවක් නැතයි කීහ. මෙසේ කීවත් පෝරිසාදයා ඒවා විස්වාස කළේ නැත. එපවත් දැන බෝධි සත්වයෝ මම කෙසේ කීවත් මොහු මා කියන දේ පිළිගන්නේ නැත. සපථයක් කොට මොහු මා කියන දේ පිළිගන්නේ නැත. සපථයක් කොට මොහු ගිවිස්වා මාගෙ සත්‍ය වචනය රකිමි. ඒ මහසත් තෙම තමා ඔහු කරපිටින් බිමට බස්වාගෙණ සපථය කොට වදරණ සේක්.

''පෝරිසාදය, මම බොරුවක් කීවේ නම් කඩුව හා බඳ පාරා වලලුගත් නොයෙක් දහස් ගණන් යෝධ සේනාව විසින් ගන්නා ලද

ඒකවල් ඇති උතුම් වූ රාජ්‍ය ශ්‍රීයෙන් නොවෙම්වයි මාගෙ මගුල් කඩුවෙන්ද මට වැඩක් නොවේවයි තොපි මෙසේ කරණ ලද මාගේ සපථය අසා මහා ලහුවී නම් බමුණන්ට ආකල අසමි කී සත්‍ය වචනයත් ඒක තොප සමීපයට එමි කී සත්‍ය වචනයත් රක්නා පිණිස නැවත තොප කරා එමියි වදාළ සේක. එපවත් අසා පෝරිසාද තෙම මේ සුතසෝම රජ්ජුරුවෝද රජදරුවන් විසින් නොකළමනා සපථයක් කරණ ලදුව හැර රජදරුවෝ නම් ජීවිතයත් කඩුවත් ගෙණ බොරුවට නොදිවුරන්නාහ. එබඳු වූ දිව්රීමක් කර සිටියදී මුන්වහන්සේ නොහරන්ට නොපිළිවන, එනසේකා,නොඑන සේක්වා, ආවොත් ආ සැටියේ දකිමියි නාවොත් මම රජක්හු බැවින් මාගෙ දකුණත ලෙයින් දේවතාවා මාරුවට බිලියම් කෙරෙමියි සිතා මහරජ, වෙහෙසන්ට නොකැමැත්තෙමි වහා නුවරට ගොස් බමුණා හා සමග කරණ ලද මන්ත්‍රණයෙන් ගැලවීමටද කී බස බොරු නොකොට වහා එවයි සමුදින.

එපවත් අසා සුතසෝම රජ්ජුරුවෝ සබඳ හෝ අමුත්තන් නොසිතා සතාරහ ගාථා සතර අසා ඒ ධර්ම කථිකයාට ප්‍රජාකොට එමියි වදාළ සේක.

"මහරජ, නුඹ වහන්සේ කරණ ලද්දේ වෙනත් රජවරුන් නොකළමනා සපථයෙක, නැවත සිහිය ඇතිවුව මැනවයි කීය. එපවත් අසා බෝධිසත්වයෝ සබඳ හෝ බාල අවස්ථාවෙහි පටන් පුරුද්දෙහි සිනාහවකටවත් බොරුවක් නොකී බව නොදත්තෙහිද? මම රාජ්‍යයෙහි පිහිටා ධර්මා ධර්ම දෙක ඉඳුරා දන්නෙම් බොරු නොකියන්නෙම් වේද හෙට දවසකට බිලියමට එන්නෙමියි ඔහු ගිවිස්වා නුවරට පැමිණි සේක. රජතුමාගෙ චතුරාන්ගිනි සේනාවම රජතුමා කුමණ උපායකින් හෝ නැවත නුවරට එන බැව් දන්නා නිසා පිට නුවරම රැඳී සිටියහ. දුර එන්නාහු රජ්ජුරුවන් දැක සතුටුව පෙර ගමන්කොට ගොස් වැඳ පිරිවරා ගත්හ.

ඉන්පසු ඇමතියො රජතුමා ස්වාභරණයෙන් සරසා ඇතු පිටට නංවා නුවරට ගොස් මාළිගාවට ඇතුළුව දෙපාපියන් බැලීමට නොගොස්

පොරොන්දු වූ බමුණා කැඳවා සියළුම රාජ්‍ය ගෞරව සහිතව ගරුසරු ඇතිව රාජභොජුන් අනුභව කරවා ධර්ම ගරුත්වය සඳහා තමාගෙ සිංහාසනයට නත්වා තමන් වහන්සෙ මිටි ආසනයක ඉඳ දෙහොත් මුදුනේ තබා ආචාරිනි නුඹ වහන්සේ මට ගෙණා සතර ගාථා අසනු කැමැත්තෙමියි ආරාධනා කළහ.

එසඳ මහබෝසතාණන් විසින්ම ආරාධිත වූ නන්ද බ්‍රාහ්මණ තෙම තම පසුම්බියෙහි තිබූ පොත අතට ගෙණ භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්මා සම්බුදු රජාණන් වහන්සේ දේශනා කළ ක්‍රමයෙන්ම රූපමදය, ඓශ්වර්‍යමදය, යෞවන මදය, පුරුෂමදය යනාදීන්වූ මදමාන භංගය කරන්නා වූ තවද සංසාර වර්ජී සියලු සත්වයන්ගෙ රාගාදි මදශාග්නියම මහ මෙසයක් බඳුවූ සසර ඉපදීම් නමැති තෘෂ්ණා දලුවට ග්‍රීෂ්ම කාලයක් බඳුව, තවද සංසාර වෘත්තියෙහි අවිලිප් නව අමෘත මහා නිර්වානයට පමුණුවන්නාවූ ඒ ගාථා සතර පොත බලා දේශනා කළේය.

යනාදි වශයෙන් බමුණානෝ තුමු පොත කියවා මුවෙන් නොබැණ හුන්හ. එසඳ මහාබෝධි සත්වයෝ ගාථා අසා එන ගමන සඵලයයි සතුටුව සිතන්නාහු මේ ගාථා සතර ශ්‍රාවක භාසිතයකුත් නොවෙයි, කවීන්ගෙ බන්ධනයකුත් නොවෙයි, සර්වඥභාෂිතය. එබැවින් මීට පූජා මිල කවරේදෝයි සිතන්නාහු මේ සතිස් ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් චක්‍රවාට ගර්භය භවාග්‍රය දක්වා සත්රුවන් පුරා දුන්නමුත් මෙතෙක් වටීදෝයි සිතූ සිතට දඬුවමටත් නොසෑහෙන්යේ. පූජාවේ අගේ කියනුම කිම්ද? එමනිසා එතකුදු වුවත් මාගෙ ආඥව පවත්නාවූ තුන්සියයක් යොදුන් කුරුරට හා සත් යොදුන් ඉඳිපත් නුවර හා සියලු සම්පත්තිය දීපියන්ට පොහොසත්මි. රාජ්‍යයට සුදුසුවූ කුසල් ඇද්දෝ හෝ නැද්දෝ හෝ ලක්ෂණ මන්ත්‍ර වශයෙන් පරීක්ෂා කොට වදරණ සේක් එබඳු භාග්‍යයක් නැති නිසා දූන සෙනෙවිරත් ඈපා මාපා ආදි නොයෙක් තනතුරු බලා ඊටත් කුසල් නැති බව දූන සම්පත්තීන් කෙළක් වස්තුවෙහි පටන් පරීක්ෂාකොට සාරදහසක් පමණ මසුරන් ලබන්ට සුදුසු කුසල් දූක දහසින් බැඳිපියලි සතරකින් පූජා කොට ආචාරිනි සෙසු දඹදිව

රජදරුවන්ට මේ ගාථා දේශනා කළ කල කෙසේ වස්තු ලැබේදැයි විචාරා මහරජ සියක් සියක් මසුරන් ලැබෙමි, එසේ හෙයින් සතාරහ නම් වීයයි කීකල

එපවත් අසා මහබෝසතාණෝ ආචාරිනි තොප ගෙණ ඇවිදිනා බඩුයෙහි අගය තොපි නොදන්න වූ එමනිසා මෙතැන් පටන් මේ ගාථාවෝ සහ සසරය ගාථා නම් වෙති. සාරදහසකින් පූජා කොට ඉක්බිති බමුණානන්ට සැප යානයක් දී යවුහ. එසඳ සුතසෝම රජ්ජුරුවෝ සතාරහ ගාථාවට සහසසාරහා පූජා කළහයි මහත්වූ සාධුකාර නාද පැවැත්තේය.

ඉක්බිති බෝධිසත්වයන් වහන්සේගෙ දෙමාපියන් දෙදෙනා එපවත් අසා ඔවුන් වස්තු කෙරෙහි ලෝභ නිසා නෙසතුටුව සිටියහ. බෝධිසත්වයන් වහන්සේ බමුණා යවා තමන් වහන්සේ දෙමව්පියන් දෙදෙනාකරා ගොස් වැඳ එකත් පසෙක සිටි දෙමව්පියන් දෙදෙනාද සොරුගෙන් බේරී ආ කථා මාත්‍රයකුත් නැතිව ගාථාවන් හතරක් අසා සාරදහසක් පූජා කළේ සැබෑදැයි ඇසීය. එසඳ බෝධිසත්වයන් වහන්සේත් පියානනි මම සියලු ගංගාවන්ගෙ ජලය දිවා රෑ නොකඩවා මහා සාගරයට ගලා ගියත් සාගරය සෑහීමකට පත් නොවන්නා සේම යම් සත්පුරිස කෙනෙක් මා සමීපයට පැමිණ මනාවූ භාසිතයක් කියන්නෙහි නම් ඒ ඇසීමෙහි සතුට පමණක් මිස සම්පත්තීන්ගෙන් මට ප්‍රයෝජනයක් නැත. ඊට හේතුව නම් වස්තුව නම් සොරුන්ට, සතුරන්ට, ගින්නට, ජලයටත් වස්තු ස්වාමිහටත් සර්ව සාධාරණය, එමනිසා අස්ථිර සම්පත්තිය මනාවූ සද්ධර්මයට පූජා කොට අනුගාමික නිධානයක් නිදන් කිරීම පින්කැමැත්තවුන්ගෙ ලක්ෂණයකැයි කියා දෙමව්පියන් සනසා වදළ සේක.

තවද පියාණන් වහන්ස සම්පත් හේතුකොට ගෙන මට නින්දකරණසේක්ද? මම බණ අසා නැවත තා සමීපයට එවියි සොරාට පොරොන්දු දී ආවෙමි. එබැවින් සබවසට දිවිපුද ආයුතුම වෙයි. නුඹ වහන්සේ සන්තකවූ මේ ඇත්, ඇස්, රථ, පාබල සේනාව, සමග වල්ලිදුනාවය, නලල්පටය, මගුල්කඩුව, සේසත චත්‍රය, මිරිවැඩිසඟලය,යි

දක්වන ලද පංච රාජ කකුධ භාන්ඩයද සියලු වස්තුකාම ක්ලේශකාමයෙන් සමෘද්ධි වූ මේ රාජ්‍යය අනුභව කළ මැනවයි පියරජතුමාට රාජ්‍යය පාවා දුන්සඳ එබස් ඇසූ පියරජ තුමාගෙ ලය රත්විය එසඳ මහත්වූ ශෝකයෙන් කුමක් කියන්නෙහිද දරුවෙනි, අපට මේ සා මහත් චතුරාන් ගිනි සේනාවන් සිටින්නේ මෙවන් ආපදව ලදි පිහිටට නොවේද? වහාම සේනාව රැගෙන ගොස් අපට හතුරු වූ ඒ සොරදෙටුවා ජීවිතක්ෂයට පමුණුවම්හ.

එසඳ මහබෝසතානො පියාණන් වහන්ස ඒ පෝරිසාදතෙම නොමරා අල්වාගෙණ ගොසිනුත් මාගේ කථා පිළිගෙණ මාගේ ධර්‍මශ්‍රවණයට බාධාවක් නොකොට නැවත මෙහි එවීම ඉතා පුදුමයකි. එනිසා ඔහු කරන ලද විශ්වාසය සඳහන් කරන්නාවූ මම ඔහුට දුෂ්ටකමක්ද මාගෙ බසට කැලලක්ද නොකොරම්යයි දෙමාපියන් අස්වසා මහරජ මම කරණ ලද මහත්වූ කුසල් ඇත්තෙමි. එනිසා චාතුර්‍මහාරාජිකාදිවූ සදව්‍යලෝකයෙහි දිව්‍යමයවූ පඤ්චකාම සැපය නම් මට ගබඩාවක පිරූ ධානය සම්පතක් සේ මට ඉතුරුව තිබේ. එනිසා රජතුමනි කෘත කෘත්තව සිටියා වූ අපවැන්නවුන්ට රජ්‍යසම්පත්තිය නම් ඉතා ලාමකය එනිසා මම පෝරිසාදයා වෙතට යමියි දෙමව්පිය දෙදෙනා වැඳ සමුගෙණ ගම් නියම් ගම්වැසි සියලු සත්වයෝද බලඇති සේනාවද අස්වසා සියලු සංස්කාර ධර්මයන් අනිත්‍යය සේ ධර්‍මදේශනා කොට සත්‍යයට දිව්පුද එදවස්ම රජගෙයි ලඟ පසුද අරුණෝදය නික්මුණු සේක.

එසඳ පසුපස්සෙහි ගලා එන ජන ගංගාව නවත්තාලිය නොහැකිව මග අවුරා නැවතී සිට බිම හරස් අතට ඉරි ඇඳ මා කෙරෙහි යමෙක් සෙනෙහසත්, ගරුත්වයත්, තිබේනම් මේ ඉරිපන්නා නොඑත්වායි වදළ සඳ සිල්වත්වූ මහතේජස් ඇති බෝධිසත්වයන් වහන්සේගේ අණ ඉක්මවාපිය නොහිම මහහඬින් මොරගා සිංහ විජෘම්භණයෙන් නික්මුනු මහාබෝසතාණන් වහන්සේ බල බලා දර්ශන පථය පසුවනතෙක් සිට හඬා වැලප නුවරට වන්හ. මහබෝසතාණෝ තමන් නුවරට ආ මාර්‍ගයෙන්ම පෝරිසාදයා වෙත මරණයට නමුත් කල්‍යාණ මිත්‍රයෙකු සමීපයට යන ආකාරයට වැඩිසේක.

මේ අතර පෝරිසාදයාද සුතසෝම රජ්ජුරුවො එත්වා, නොඑත්වා රුක්දෙවියා මගෙන් යමක් බලාපොරොත්තුවෙන්ද, සුතසෝම රජ්ජුරුවන් වෙනුවට මාගෙ දකුණත කපා මසුත් ලේත් මේ සිටින රජදරුවන් සිය දෙනාගෙ මසුත් ලේත් සමග මේ ගිණිඅඟුරු බැසපු කලට මේ උලෙන් ඇන මස් පූජා කරමි,යි සිතමින් ලී උල සකස් කරමින් සිටිනා අතර පසු පසින් ශබ්දයක් ඇසී බලන කල සුතසෝම රජතුමා සිටිනු දැක්කේය.

එවිට පෝරිසාදයාට මහත් සතුටක් ඇතිවී ''මහරජ, නුවරට ගිය නුඹ වහන්සේ කළමනා කටයුතු නිමකර වැඩිසේක්''දැයි විචාරා එසඳ අපමණ බෝධි සත්වයේද මිත්‍රය තොප නිසාමට භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්මා සම්බුදු රජාණන් වහන්සේ දේශනා කරඑ ලද සතර ගාථාවන් අසා කළමනා සියලු කෘත්‍යයන් නිමකර දැන්මම තොපට පොරොන්දුවූ ආකාරයට ආවෙමි. දැන් තොපගෙ කැමැත්ත අනුව මා මරා කැමතිනම් මස් අනුභවය කරව, නොඑසේනම් රුක් දෙවියාට පූජාකරව තොපගෙ කැමැත්තක් කරව''යි වදළ සේක. එපවත් අසා පොරිසාද මේ රජ්ජුරුවෝ කිසි බයක් නැතිව මා ඉදිරියෙ කථා කරන අපූරුව, ඒ කාන්තනෝ මොහු අසපු බණෙහි බලයක් විය යුතුයයි සිතා, මේදර අඟුරු බවට තවම පත් වුණේ නැති නිසා මස් පුළුස්සන්න ගිනි අඟුරු ගොඩ පදම් වෙනකල් තොප ඇසූ ගාථා හතර මටත් කියවයි කීහ.

එපවත් අසා බෝසතානෝ පෝරිසාද තෙමේ තමාගෙ පව්වූ ගරුක ස්වභාවකොට ඇත්තේය. එබැවින් (මේදර ගොඩ ගිනි අඟුරු බටකල) මඳක් ඔහු නලවා නිග්‍රහකොට ලැජ්ජා කරවා පසුවකියමියි සිතා, ''පොරිසාදය, තෝ ඉතා අධර්මිෂ්ඨයෙකි, බඩජාලිකමට තෘෂ්ණාවට ගැතිව ඊනියා රාජ්‍ය සම්පත්තියෙන් ද පිරිහුණේ ද එසේ හෙයින් නිරන්තරයෙන් මළකුණු ගැවුණු අත් ඇතුව මළකුණු අනුභව කරන්නෙහිය. එමනිසා තා කෙරෙහි සත්‍යවාදි ගුණයක් නැත. දරුණු මිනීමරු පාපකාරි වූ තට නවලෝකුත්තර දහම් ඇසීමෙන් කවර ප්‍රයෝජනද? එම්බල, ධර්මාධර්මදෙක සාගරයේ එතෙර මෙතෙර රඳන්නට රන් බඳුන සුදුසු වූවාට මැටි බඳුනේ සිංහලේ රඳන්නේ නැතිවාසේම තොප වැනි දරුණු පාපකාරීන් අපාය

මාර්ගයට පිවිස සිටින්නවුන්ට ඇසීමෙන් වැඩක් නැත.

එම බුද්ධාදි උත්තමයන් වහන්සේලා හොඳයි සැපයි කියා පෙන්වා වදාළ වූ එම ධර්මය අපවැනි සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන් පුරුදු කරන්නාවූ ස්වර්ගගාමීව සිටි මහෝත්තමයන් විසින් අසා දූරූ නව ලෝකුත්තර ධර්මය තොපවැනි පවිටන්ට ඇසීමෙන් කිනම් පලයක්ද?යි වදාළ සේක. එසේ නිග්‍රහකොට වදාළ බෝසතාණන් වහන්සේගෙ මෛත්‍රී ආනුභාවයෙන් කෝප නොවී තමාද ශිෂ්‍ය භක්ති හෙයින් වෙනත් උපමාවක් ගෙණහැර දක්වමින් මහරජ, සියලු දඹදිව් තලයෙහි රජදරුවෝ සර්වාලංකාරයෙන් සැරසී මහත්වූ බලඇති සෙනග පිරිවරා උතුම් මුවන් විද මරන්නාවූ සමහර කෙනෙක් නොකන බවමුත් අර්ථය පිණිස පුරුෂයන් මරන්නාහු මේදෙකින්ම පරලොව විපාක සමානය.

එමනිසා නුඹ වහන්සේ කුමක් පිණිස මාව අධර්මිෂ්ට කොට කියනසේක්ද? ඉදින් ඒ මෘගමාංශවිෂව මුවන් බරාකන්නාවූ සෙසු රජදරුවෝ නිර්දෝෂයෝ වීනම් පුරුෂ මරණය කරන්නාවූ මමත් නිර්දෝෂ වෙම්ම යයි කියා එපවත් අසා සුතසෝම රජ්ජුරුවෝ ඔහුගේ ලබ්ධිය බිඳ උදහරණයක් ගෙණහැර දක්වන්නා වූ ''සබඳ පෝරිසාදය, රාජධර්මයන් රක්නා රජදරුවෝ ඇතුන්, වලසුන්, දිවියන්, බල්ලන්, බලලුන් ආදිවූ පස්නිය ඇති සතුන්ගෙ මස් නොකන්නෙහිය. යථොක්තවූ පස් ජාතියද තම තමන්ගෙ වරිගෙ වුන්ගෙ මස්ද නොකන්නාහු තෝ වනාහි පස්නිය ඇති නොකෑයුතු තමාගෙ ජාතියේම මස් කන්නෙහි තිරිසන් සතුන්ටත් අන්තවද?යි වදාළ සේක.

එපවත් අසා පොරිසාද බලවත්නි, ග්‍රහයට පැමිණ වෙනත් දෙයක් නොදන්නේ තමා කළ පව් යට කොට වෙනත් උදහරණයක් ගෙණහැර කියන්නේ මහරජ ඔබ වහන්සේ මා වැන්නකුගෙන් ගැලවීගෙණ සියළු පඤ්චකාම සම්පත්තියෙන් සමෘද්ධ වූ ස්වකීය භවනයට ගොස් පසමිතුරු වූ මා වෙත නැවත ආවේය. ඒ තමා රාජධර්මයට අයත්දැයි කීය. ඉක්බිති මහබෝසතානෝ සබඳ රාජධර්මයෙහි දක්ෂ කෙනෙක් මට වඩා මෙලොව නැත. දිනපතා උදය රේඛාව නොවරදවා නැගෙනහිරක් සෙයින්

දශරාජධර්ම නමැති රේඛාව නොවරදවා පවතීද සකල ලෝකයෙහි ව්‍යාප්ත වූ කීර්ති ඝෝෂා ඇත්තෙමි. එමනිසා දශරාජ ධර්මයට ඇතුළත්ව සීලයෙහි අන්තර්ගතව සබ වසරක්නා පිණිස තොප වැනි චණ්ඩ සත්වයෙකු කරා නැගී ආමි මාගෙ සබවසට කැලලක් වී නම් තොපවැනි පාපිෂ්ට තත්වයටම නියම වූ තර්කයට යන්නෙම් වේද, එසේ හෙයින් ලාමක ක්‍රියාවට ඇතුළත් නොවන පිණිස සබවසට ජීවිතය පිදූ වෙමියි වදාළ සේක.

ඉක්බිති පෝරිසාද තෙම මහරජ වස්ත්‍රාභරණ ධන ධාන්‍යාදියෙන් පිරුණාවූ සියළු පොළොවද තුන් සෘතුවද කරණ ලද්දවූ දිව්‍ය විමන් බඳුවූ උතුම් වූ ප්‍රසාදත්වයද සොළොස් දහසක් පමණ දෙවඟනන් බඳු වූ වරඟනන්ද චතුරාංගිණී සේනාවද මේ සා මහත් රාජ සමෘද්ධිය හැර සබවසයෙහිකවර ආනිශංසයක දැක සබවසට දිවි පිදූසේක්ද?යි විචාලහ. එසඳ මහ බෝසතාණෝ විචාළ බසට අනුරූප වූ ධර්ම කථාවක් ගෙණහැර දක්වන සේක් සබඳ මේ පොළෝ තලෙහි විද්‍යාමාන වූ යම්කිසි රසයක් ඇත්නම් ඒ සියලු රසයන් කෙරෙන් සත්‍ය වචන නමැති රසයම උතුම් ඊට කාරනා කිම්දයත් සබවසෙහිම සිටියා වූ ශ්‍රමණ බ්‍රාහ්මණාදි වූ හැම ජාති ජරා ව්‍යාධි මරණාධි වූ සකල දුක්ඛ නමැති සාගරය මෙන් එතරව සාන්තිපුරයට පැමිණෙන්නාහුයයි මෙසේ ඒ බෝධි සත්වයෝ සර්වඥතාඥනයෙහි පැහැර කඩාකන්නට ආ බළලකුට තමා අත තිබූ ඝන රන් සැරයටියකින් පහර දුන්නා සේ උතුම් ධර්මයෙන් නිඃශ්‍රිත වූ ඕහට ධර්ම දේශනා කොට වදාළ සේක.

එසඳ පොරිසාද තෙම මේ සා අඟුරු රැසක් හා සස්නා ලද උල් ආදිවූ නොයෙක් කන්කටුල් බල බලා ධර්ම දේශනා කරන්නාවූ මෛත්‍රියෙන් පිරුණු මේ මුහුණු කිසිම බිය මාත්‍රයකුත් නැත. මෙසේ මාහට කිසි බයක් ගෞරවයක් නැතිව කථා කරන්ට ගාථා සතරේ බලයක්ද, සබවසයෙහි අනුහසක්ද? නොඑසේ නම් කුමණ ආනුභාවයක් ඇතුව මෙසේ කථාකරම්ද?යි සිතා, ''මහරජ, මිනීමරුවෙක්ගෙන් ගැලවී මධුර වූ පංචකාම ගුණයෙන් ගැවසීගත් ඔබ වහන්සේගේ රජගෙට ගොස් එබඳු

රාජශ්‍රීය අපේක්ෂා නොකොට නැවත මාවෙත ආවේය. එමනිසා ඔබ වහන්සේ මරණයට බයක් නැත්තේ කුමණ කාරණයක් නිසාද?

ඉක්බිති බෝධිසත්වයන් වහන්සේ සබඳ මා විසින් බුද්ධාදී වූ සත්පුරුෂයන් විසින් ප්‍රශංසා කරණ ලද දාන ශීලාදි දශ පුණ්‍ය ක්‍රියා වස්තු නොකඩ කොට පුරණ ලද තවද පොරිසාදය දෙමාපිය දෙදෙනා වහන්සේටද මනාකොට උපස්ථාන කරණ ලදිමි. තවද බන්ධු වර්ග මිත්‍ර පුත්‍ර කලත්‍රාදීන්ද ඔවුනොවුන්ගෙ බලාපොරොත්තු පරිද්දෙන් උදව් උපකාර කරණ ලදිමි. එමනිසා සබඳ නිවන් පුරයට යන්නාවූ මග මාසේ එලි කලේ නැත. ධර්මයෙහි පිහිටියාවූ මම කවර කාරණයකින් මරණයට බියදැයි එනිසා තා මාගෙ මස් අනුභව කළත්, මා පුලුස්සා මාගෙ මස් වලින් යාග කලත් තට වරදක් පමණකැයි වදාළ සේක.

මෙසේ බෝසතාණන් වහන්සෙ බණ වදරන පෝරිසාද සිතන්නේ මේ සුත සෝම රජ්ජුරුවෝ උතුම් සත්පුරුෂ ධර්මයෙහි පිහිටියාය. ඥාණ සම්පන්නයහ. මධුර භාසිතය. මොහු මරා යාග කළොත් නම් මට මහත් විනාශයක් ශාපයක් නම් ඒකාන්තයෙන්ම වන්නේ යයි බයින් ත්‍රස්තව මහරජ, ඔබ වහන්සේ වැනි සත්‍යවාදි රජෙක් යමකු විසින් මැරුයෙ නම් සැර වස විෂක් අනුභව කලාවැනිය යි කියා, නැවත සතර ගාථා අසනු කැමතිව ආදර ගෞරවයෙන් මහරජ සත්වලෝකයෙහි යම්කිසි සත්වයෙක් බණ ඇසීමෙන් කුසලා කුසල විපාක දන්නා වූ එබැවින් මමද ඔබ වහන්සේගෙන් ඒ සතර ගාථා අසනු කැමැත්තෙමි. මගෙ සිතද දූන් ඔබ වහන්සේ පෙන්වා වදරපු දහමට ඇලෙයි කියා යාච්ඤා කළේය.

ඉක්බිති මහබෝසතානො දූන් මොහුගෙ ලය අර්දවිය දූන් බණ කීමට නියම කාලයයි සිතා වදරා සබඳ එසෙනම් මනා සිහියෙන් යුතුව අසන්නැයි කියා නන්ද බ්‍රාහ්මණයා කී ලෙසම ගාථා සතර දේශනාකොට තමන් සූක්ෂම වූ නුවණින් විනිවිද දන්නා වූ අර්ථ දක්වා වදරණ සේක.

1. සබඳ කල්‍යාණ මිත්‍රයන් සමග එක වාරයක් කරණ ලද ආශ්‍රය බොහෝ දවසක් මෙලොව පරලොව වැඩ සාද දෙයි. තවද අසත්

පුරුෂයන් සමග අවුරුදු සියයක් එකට වාසය කළත් දවසකටවත් ඒකවරණයක් නැත.

2. තවද මහරජ සියළු ඉරියව්වෙහිම නුවණැති පණ්ඩිතවරු හා එක්වම වාසය කළයුතුමය. ඒ එසේම යයි සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන් පුරුදු කරන්නා වූ සත්පුරුෂයන් හා එක්වූ සත්ව තෙම එම ධර්මය උතුම් සේ දැක පුරුදු කරණ ලදුව සවුපසේ බුදු තැන් ලැබෙයි. එසේ හෙයින් ඒ ධර්මය පුරුදු කරන්නාවූ සත් පුරුෂයන්ට සියලු ලෙසින් සඵල වන්නේය.

3. තවද පෝරිසාද රජතුමනි රජදරුවන්ට අග්‍රවාහනය වූ මනාවූ කර්මාන්ත ඇති රථයය මෙසේ කිසි කලෙක දිරායේද එමෙන්ම ද්වාත්‍රිංශත් කුණපකොට්ඨාශයන් සමාධාන වූ මේ ශරීරයද කලෙක ජරාවට පැමිණෙයි. එය ජරාවට නොපැමිණෙන්නේ කෙසේද යත් සත් පුරුෂවාසයෙන් පැමිණෙන්නා වූ ගුණ ධර්ම ජරාප්‍රාප්ත නොවෙයි. කවරකාරණයෙන්ද යත් එසත් ධර්මය පුරුදු කළාවූ ජරාවුවද ජාති ජාතියෙහි ඒ ධර්මයෙ බලයෙන් බොහෝ සම්පත්තියෙහි රූපයෙහි යෞවනයෙහි ඓශ්වර්යයෙහි ආදිපත්‍යහෙි පිහිටුවන ලද හෙයිනයි දනුව.

4. අහසට පොළොව සෙයින්ද සාගරයට එතෙරට මෙතෙර සෙයින්ද ධර්මා ධර්මදෙක එක් නොවෙතියි නුවණැත්තෝ කියති. අසත්පුරුෂ සමාගමයෙන් පිහිටියාවූ අධර්ම සමාදනයෙන් ඇත්තාහුද, සත්පුරුෂ සමාගමෙන් ලත් අවවාද පිළිගෙණ විසුවහොත් සසර සයුරෙන් එතර විය හැක්කැයි යනාදීන් සියලු වන දේවතාවන් ලවා සාධුකාර දෙවමින් ඔහුට සතර හා ගාථා අර්ථ වදළ සේක.

මෙසේ මහ බෝධි සත්වයන් මිහිරි වූ කටහඬින් ධර්ම දේශනා කරත් කරත් තමාද ව්‍යක්ත බැවින් මේ හිමියාණෝ මතු බුදුවන උත්තමයාණන් කෙනෙකු විය යුතු යයි සිතන්නට වන් කල්හි සියලු ශරීරය පස්වණක් ප්‍රීතියෙන් පිණා ගියේය. එසඳ මහබෝසතාණන් කෙරෙහි මොලොක් වූ සිත්ඇතිව රාජ්ජය දුන් පියාණන් සතුටුව ඇසින් බලා මම ඔබ වහන්සේට දීමට සුදුසු වූ රන් රුවන් මුතු මැණික් ආදීවූ වස්තුවක්

නොදත්මි, මේ මේ අර්ථ ව්‍යංජන සහිතවූ ගාථා අසා සතුටු වුයෙමි. ඔබ වහන්සේට ගාථා හතරට වරහතරක් දෙමි. එය ගත මැනවයි කියා, එපවත් අසා බෝධි සත්වයෝ සබඳ තොපට වන්නා වූ මරණයත් නොවන්නේ හිතට වන්නා වූ මෙලෝ පරලෝ දෙක්හි වන්නා වූ අර්ථානර්ථ නොදක්නෙහිය. සබඳ මේ සත්ව ලෝකයෙහි මා ඇතුළුවූ සියලු සත්වයෝ මරණ ධර්මයෙන් විනිර්මුක්ත වූ සත්වයෙක් නැත. එනිසා නුවණැත්තාවූ සත්වයෝද මරණ එකාන්ත සේ දැක මරණින් මත්තෙහි තමන්ට හිත කැමතිව පරලෙව්හි සුව සඳහා පණිවා ආදිවූ පස් පවින් වැළකෙන්නාහුය. මරණවත් මරණ මත්තෙහි වන්නාවූ සවර්ගා පාය දෙකත් අපෙක්ෂාව නැත්තෙහි මින් මට වැඩක් අවඩැක් වන්නේ යයි නොසිතා පාපකර්මයෙහිම යෙදෙමින් මිනීමරා අනුභව කරන්නෙහිය. එසේවූ තැනැත්තාවූ විසින් දෙම්මැයි කී වරය තිරයයි සිතා හැරගන්ම පණ්ඩිතකමට ඇතුළත් නොවන්නේ වේදැයි වදළ සේක.

ඉන්පසු පෝරිසාද කියන්නේ මහරජ ජීවිතය යෙත්වා ඔබ වහන්සේට මාදෙන වරයට හානියක් කිසි දිනක නොවේ, මා කෙරෙහි සැකයක් නොසිතා දෙන වරම ගන්නැයි කීය.

එවිට බෝධි සත්වයො මොහු ඉතා බුහුටිව කියන්නේය. එනිසා එනිබ්බ වර ගතමනා කළ එතකුදු වුවත් මිනීමස් නොකෑයුතු යයි යනවර පළමු කොට ගතිම් නම් බලවත්ව මිරිකෙන්නේය. එමනිසා පළමුකොට අවශේෂ වු වරතුණ ගෙණ පසුව එකියන වරය ඉල්වා ගණිමියි සිතා සබඳ, උත්තමයෝ උත්තමයන් සමග මිතුරුකම් පවත්වති. එසේම ඥාණවන්තයන් එක්වන සුල්ලභ උත්තම ජාති දෙපක්ෂයෙහි ඇත්තවූන් සමග වාසය උතුම් වන්නේය. එනිසා අවුරුදු සියයක් ජීවත්වන්නා වූ තමාගෙ දෑසින් දක්නා අභිප්‍රාය ඇත්තෙම් ඒ වරය පළමුකොට දෙවයි. පෝරිසාදයන්ගෙ ජීවත්වීමක් කැමති ඌවක් හුමෙන් තමන් වහන්සේ ඉතා ව්‍යක්ත බැවින් මාගෙ ජීවිතය දෙවයි නොඉල්ලා ඔහු අවුරුදු සියයක් ජීවත්වීම තමා දක්නේ තමාගෙ ජීවිතය ඇවිති හෙයින් වේදැයි ප්‍රශ්නකොට

අවුරුදු සියයක් ජීවත්වන්නා වූ තාදක්නා කැමැත්තෙමි. මෙකියන වරය පළමුකොට ඉල්ලූ සේක.

එසඳ පෝරිසාදයෝ මේ රජ්ජුරුවෝ තමන්සේ එබඳුවූ තමන්ගෙ යශඓශ්වය්‍යීකින් පිරිහෙළා අල්වාගෙණ මරාකන්ට සිතූ මා සුඛී සුවපත් වෙනවාට කැමතියි මෙතුමාගෙ තිබෙන පරහතකාම්බව මා කෙරෙහිත් මෙපමණ කරුණා මෛත්‍රියක් තිබෙන සැටියයි සිතා සතුටු සිත් ඇත්තෙම් වඤ්චා කොට වරය ගත් බව නොදූන වරදෙන්නා වූ තැනැත්තේ.

එසේය මහරජ උතුම් වුවද නුවණ ඇත්තවුන්ගේද සහවාසය යනු නුඹ වහන්සේ වදළ ලෙසම උත්තමය අවුරුදු සියයක් ජීවත්වන්නාවූ මා සුවසේ දූක වදළමැනවැයි යන මේ පළමු වන වරය දෙමි අරගත මැනවයි දින. ඉක්බිති බෝධිසත්වයො දෙවෙනිවරය ඉල්ලන්නා වූ මහරජ යම් සේ එක් සියයක් රාජධානියෙහි රජදරුවෝම පැමිණෙන ලද්දවූ අභිෂේක ඇත්තාවූ තම තමන්ගෙ නමින් ඒ ඒ ස්ථානයෙහි පළමු ස්තුති ඝෝෂා ඇත්තා හා මහත් ඓශ්වය්‍යීයෙහි පිහිටියාවූ ඒ රජදරුවන් රජෙකු විසින් මැරිය හැක්කේ නොවෙයි. එහෙයින් එක්සියයක් රජදරුවන්ගෙ ජීවිතදනය දෙවයි දෙවෙනි වරය ඉල්ලූ සේක.

ඉක්බිති පෝරිසාදයො එම වරයත් ඔබ වහන්සේට දිනිමියි මෙසේ දෙදෙනා කරණ කථාව ඇතැම් රජදරුවෝ අසන්නාවූ පුරා නොව අසන්නට කාරණා කවරේද යත් පෝරිසාදයෝ ගසට දූම්වැද ගනිත්දූයි යන භයින් මදක් දුරුකොට දරසෑය බැඳ ගිනිකල හා එසේ හෙයින් නුග ගසම හා දරසෑයට අතුරෙහි දෙදෙනා කරණ අවස්ථාවෙන් සමහරක් අසා සතුටුව නාබෝකලකින් සුතසෝම රජ්ජුරුවන් වහන්සෙ පෝරිසාදයානන්ද දමනය කරන සේක. භිය නොවවයි අස්වැසූහ.

ඉක්බිති බෝධිසත්වයෝ තුන්වන වරය ඉල්ලනසේක් මහරජ සියයක් රජදරුවෝ තා විසින් අල්ලාගෙණ අතුල්තල විද නුග ගස එල්ලන ලද්දවූ තම තමන්ගේ ජීවිතයට සෝකයෙන් හැමවේලෙහි මුණ හුනු කඳුලෙන් හඬන්නාහුය. එසේ හෙයින් බන්දනගතවූ ඒ රජදරුවන් මුදහැර

උන් උන්ගේ රාජ්‍යයෙහි පිහිටුවාලුව මනා වරය තුන්වෙනිව ඉල්ලමියි වදළ සේක. කුමක් පිණිසද යත් රජදරුවන්ගෙ ජීවිත දනය දුන්නද වෛරයක් උන්හැම තමාට දස්කොට වනයෙහිම රඳවන්නාක් වත් නැත්නම් ජනපදවලට ගොස් විකොට පියන්නක් වත් කෙළෙම්නම් නපුරුයි උන්උන්ගේ රාජ්‍යයෙහි පිහිටුවන්නා වූ තුන්වන වරය ගත්සේතැයි දත යුතුය. පෝරිසාද තෙම එම වරයද දුන්හ.

ඉක්බිති සුතසෝම රජ්ජුරුවෝ හතර වන වරය ඉල්ලන සේක් රජ්ජුරුවෝ හතර වන වරය ඉල්ලනසේක් මහරජ මේ දඹදිව එක්සියයක් රාජධානිය සම්බන්ධවූ නොයෙක් ගම් නියම්ගම්වාසි මනුෂ්‍යයෝ පෝරිසාදයාත් ඇවිත් අප අල්ලන්නේය. නැවතත් ඇවිත් අප අල්ලා මරා කන්නේ යයි සිතා තොප කෙරෙහි ඇති භය නිසා සැනසිල්ලේ නිම්හිල්ලෙ සිටි ජනයා ආරක්ෂා ස්ථානකරාද සැඟවීත් තොපගෙන් ආරක්ෂාවක් නැතිවත් නුවර හියෙන් ජන ශූන්‍ය බවට පත්විය. එමනිසා නැවත එවන් තත්වයකට ඉඩනොතබා තා කෙරෙහි තිබෙන සැක භිය නැතිවීම පිණිස මිනීමස් කෑමෙන් වලකිම්යි කියා සතරවන වරයද ඉල්ලූසේක.

මෙසේ මහබෝසතාණන් මෙලොව හඟවා වදළ කළ නරක භයින් ත්‍රස්තවම සුතසෝම රජ්ජුරුවන්ට දෙමි කී වරය නොදිත්බැරිය. මිනීමස් කෑමෙන් වළකින්ටත් බැරිය මොනවා කරම්දෝයි කළකිරුණු සිතින් යුක්තව මහරජ, මිනීමස් මට නොකාබැරිය එමනිසා එම වරය වෙනුවට වෙනත් වරයක් ඉල්ලුව මැනව,යි කීය.

බෝධිසත්වයො එපවත් අසා වදරණසේක් සබඳ යම් සත්ව කෙණෙක් මෙමට ප්‍රියයයි ආත්ම ස්නේහය හැර අකුශල කර්මයෙහි ව්‍යාපෘතව කරණු කාරණා පරීක්ෂා කොට ගත නොහෙන්නාවූ ප්‍රිය සේවනය පිණිස විෂ මිශ්‍රවූ රා අනුභව කොට එතනම මැරී වැටෙන්නාවූ බේබද්දන් පරලොවදී නිරයෙහි උපදනාහුය. තවද මහරජ මේ ලෝකයෙහි යම් සත්වකෙණෙක් නුවණින් පරීක්ෂා කොට සුරාපානාදී වූ ප්‍රියකාරණය

කායික චෛතසිකවූ දුකට හේතුවයි නුවණින් දැන එබඳු වූ අර්ථ ව්‍යඤ්ජනයෙන් ඉවත්ව උත්සාහයෙන් දන ශීලාදිවූ සුචරිතයෙහි යෙදෙන්නේය. එසේවූ සත්ව තෙම තිත්තකටුකාදී ඖෂධ අනුභවයෙන් නිර්ව්‍යාධි වන සත්වයක්හු මෙන් තමා කළ සුචරිතයාගෙන් මෙලොවත් සැපවිඳ මිය පරලොව ගිය කල්හිත් දිව්‍ය මනුෂ්‍යාදී සම්පතට පැමිණ සුවපත් වන්නේ යයි වදාළ සේක.

එපවත් අසා පෝරිසාද තෙම බැගෑපත්ව අඬන්ටවන්ය. "මහාවීර පුරුෂයාණෙනි, මේ මිනී මසෙහි කළ ලෝභයෙන් ජීවිතය හා සමකොට සිතන්නා වූ මව්පිය දෙදෙනා ද මනොඥවූ වස්තුකාම කෙලශකාමයෙහිද ආලය හැර හුදකලාව වනයට වැද මේ නියාවූ එබඳු මිනීමස් කෑමෙන් වැලකෙමියි යන වරය කෙසේ දෙන්නද එම වරය දීමට මට නුපුළුවන වෙන වරයක් ගනු මැනව.

නැවත බෝධිසත්වයෝ එම්බා පෝරිසාදයෙනි නුවණැත්තාවූ උත්තමයෝ දෙබසක් නොකියාම ඇත්තම කියති. එබඳුවූ තොපිත් කැමති වරයක් ඉල්වාගණුවයි මට කියා දැන් මා ඉල්ලූ වරයට අකමැති වීම නිසා තොප මුලදී කී වචනය වෙනස් කරන්නෙහිද? මිනී මසෙහි කළ ලෝභයෙන් කර්‍මප්‍රාප්ත වූද බොහෝ අකුසල් අකීර්තිව අයසට පැමිණියා එබඳුවූ මිනීමස් කමින් කෙසේ වරයක් දී පියම්ද?

නැවතත් බෝධි සත්වයෝ, පෝරිසාදයාණෙනි යම් කෙණෙක් කැමති වරයක් දෙමි. යමෙකුට කීවාම නැවත එය දීමට මැලිවේ නම් එසේ වූ වරය නොදිය යුත්තේය. තොප මට සබඳ සැක නොකොට කැමති වරයක් ඉල්වා මාගේ ජීවිතය හා ලයත් හැර වෙනත් තොප ඉල්ලන වරයක් දෙමි. මට එසේ කියා මට උවමනාවරය දෙතුන් වරක් ඉල්ලාත් එය දීමට බැරිනම් තොපගෙ වචනයෙ සත්‍යතාවයක් නැත. තවද මේ ලෝකයෙහි සත්වයෝ අත්පාදිය රැක ගන්නා පිණිස සම්පත් දී පියන්නා හා ජීවිතය රැක ගන්නා කැමැත්තේ හස්තපාදදී අවයවය හැර පියන්නේය සත්‍ය වචනය සංඛ්‍යාත වූ සුචරිත ධර්‍මයාගේ ආණිසංස සිහිකරණ සත්වයෝ අවයව ධන

ජීවිතය යන මේ සියල්ල හැර සුචරිතයම පුරති. රාජෝත්මයාණෝ එසේ හෙයින් මට දෙමි කී වරය නොමැලිව වහාදී සත්‍ය වචනය කුසලය පුරා ගණුවයි යනාදීන් නොයෙක්කාරණා කියා පෝරිසාදයාත් සත්‍ය වචනයෙහි පිහිටුවා ඉක්බිති බෝධිසත්වයාණෝ තමන් ගරු බව දක්වන්නාහු පෝරිසාදයෙනී යමක්හු කෙරෙන් යමෙක් කුසලාකුසල ප්‍රකාශක වු බණ කථාවක් උගත්තේද යම් අත්තමයෙකු යමෙකුගෙ සිත සැකයේ දුරුකොට නිශ්ශංකා කෙළෙද එසේ වූ ආචාර්‍ය්‍ය තෙම එබඳු වූ පුද්ගලයෙක් හට නැව්නැගී ගිය සත්වයෙක් හට ගොඩබිමක් ලැබුණා වූ පරිද්දෙන් පිහිට වන්නේය. භයක් පැමිණි කළ පලාගොස් දිවි ගලවා ගන්නා තැනක් පරිද්දෙන් පරම ප්‍රතිෂ්ටාද වන්නේය. එබඳුවූ උත්තමයා සමග කළ මිත්‍රත්වය නුවණැත්තෝ නොදිරවන්නේය. නොනසා රක්නේයයි යනාදීන් සබඳ පෝරිසාදයෙනි යහපත් ගුණ ඇති ආචාරිකෙණෙකුන්ගෙ කීම් නොගිවිසීම කටයුතු නොවෙයි. මම තොප බාලකල ප්‍රිට්ඨි ආචාරිව බොහෝ ශිල්ප ඉගැන්වීම් දැන් බුද්ධ විලාසයෙන් සතර හා ගාථා කීම් එසේ හෙයින් මා කීවා කරන්ට තොපි සුදුසු වන්නාහයි කීහ.

එබස් අසා පෝරිසාදයෝ සිතන්හු සුතසෝම රජ්ජුරුවෝ මට ගුරුවරයත් විය. මා විසිනුත් කැමති වරයකුත් ගණුවයි කීම වරයකුත් දෙන ලද දැන් ඉතින් මොනවා කරන්නද, එක් ජාතියෙක උපන් කළ මියයාම ඒකාන්තයෙන්ම සැබෑව මින්සු මිනීමස් නොකමි, යන වරය දෙමියි කඳුළු ධාරා වැහෙන මුහුණින් යුක්තව උණස්නෙන් නැගිට සුතසෝම රජ්ජුරුවන් ශ්‍රීපාද මූලයෙහි වැඳ වැතිර සබඳ, සුතසෝම රජතුමනි, ඒකාන්තයෙන් ඒ මිනීමස් කැමට ප්‍රියය. එමනිසා රාජසම්පත්හැර මහ වනයට වැදුනෙමි. ඒ බැව් දැන දැනත් එයින් මට වළකින්ට කියන්නෙම් නම් නිරාහාරව පනගියත් තොපට මම එව වරයත් දෙමි මින්පසු මම මිනීමස් නොකමි''

එබස් අසා බෝධිසත්වයෝ ''සබඳ, පෝරිසාදයෙනි, එසේමය සීල ගුණයෙහි පිහිටා සත්වයාගේ මරණයත් උතුම් යයි කියමි. ''මහරජ තොප

විසින් මටද වරය දීපියන්ට වදාළද පටන් ආයර්‍යමාර්ගයෙහි පිහිටායව එනමුත් නැවතත් යාචිඤ කෙරෙමි එසේ හෙයින් මා කෙරෙහිම තොපගේ මෛත්‍රියෙක් ඇත්නම් මහරජ පන්සිල් ගණුවයි කීහ.''

එබස් අසා පෝරිසාදයෝ යහපතැයි සබඳ මට පන්සිල් දීලවයි කියාම බෝධි සත්වයන් ගෙ දෙපා නැමඳ එකත්පස්ව උන්නේය. මහබෝධිසත්වයෝත් එබඳු තද රුක්ෂ ගුණයෙන් යුත් මිනීමස් කා ඇවිදිනා වූ පෝරිසාදයන් නොයෙක් බණ කථා හා හේතු කාරණා වචනයෙන් මොළොක් සිත් ඇති කොට ඒ ජාතියෙහි අනුන්ගෙ ජීවිතය නොනසන සේ පඤ්චශීලයෙහි පිහිටු වූහ. එකෙණෙහි එතනට රැස්වූ භූමාටු දෙවියෝ මහ බෝධිසත්වයන් කෙරෙහි සමාධිව අවීචියෙහි පටන් භවාග්‍රහ දක්වා ලොක කුහරය මුළුල්ලෙහි දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීන් පෝරිසාදයන් මිනීමස් කෑම වලකාලන්ට නිසි කෙනෙක් නැත.

සුතසෝම රජ්ජුරුවන් කළේ දුෂ්කර කාර්‍යයකි කළ දෑ ඉතා යහපතයි වන ලැහැබ එක කොලාහල කෙරෙමින් තුඩ තුඩ සාධුකාර දුන්හ. භූමාටු දෙවියන්ගේ සාධුනාදය අසා චාතුර්මහාරාජාකාදි දිව්‍ය ලෝකයෙහි දෙවියන් ඇතුළු සදිව්‍ය ලෝක දෙවියෝද සොළොස් බ්‍රහ්ම ලෝකවල බ්‍රහ්මරාජයන් ද ඒ අනුව සාධුනාද පූජා කළහ. එදවස් සුතසෝම රජ්ජුරුවෝ පෝරිසාදයන්ට බණ කියා පඤ්චශීලයෙහි පිහිටුවා ලූහ. ඒ ආශ්චර්‍ය දැක සමාධි වූ වෘක්ෂ දේවතාවා දුන් සාධුකාර ශබ්දය අසා සුතසෝම රජ්ජුරුවන් කළ සේ ඉතා දුෂ්කරය දෙවියන් විසිනුත් දමනය කිරීමට නොහැකි සාහසික ක්‍රියා ඇති අප්‍රවිත්ත වුහු දමනය කිරීම ඇසූ ඇසුවන් සතුටු වූහ. පෝරිසාදද රජ්ජුරුවන් වැඳ එකත් පසෙක සිටියේය. එවිට බෝධි සත්වයෝ රජ දරුවන් බැම්වලින් නිදහස් කළොත් යහපතයි කීහ.

ඒපවත් අසා පෝරාසාද තෙම මේ රජදරුවන් සෑම දෙනම මාගෙ තරහාකාරයෝය. මම තනියම මොවුන් බැම්වලින් නිදහස් කළොත් මා වටකර ගෙන මරා දමයි එසේ වුවොත් නපුරක්මයි මමද සුතසෝම

රජතුමාගෙන් පන්සිල් සමාදන්ව සිටින නිසා ජීවිතය ගියත් මට කිසිම ක්‍රියාමාර්ගයක් ගත නොහැකියි එමනිසා සුතසෝම රජ්ජුරුවන් සමගින්ම ගොස් මොවුන් බැම්වලින් මුදමියි සිතා ස්වාමීනි අප දෙදෙනාම ගොස් රජදරුවම් මුදවමුයි කීය."

එපවත් අසා බෝසතානො දෙදෙනාම යහපතැයි කියා නුග ගස ඡායාව අන්තරයට ගොස් සිතන සේක් රජදරුවෝ නම් ඉතා දග්ධ වූ මාන්නක්කාරයෝය, එනිසා මොහු අපට කළ නින්දව වෙහෙස මරා දැමීමට සූදනම්වීම නිසා, මොවුන් නිදහස් කළ කල පෝරිසාදයා අල්වා මැරුවොත් මගෙ උත්සාහය, වික්‍රමය අපතේ යන නිසා මොවුන්ගෙන් ප්‍රතිඥා ගෙනම මිදිය යුතු යයි සිතා වදරණ සේක් ''මා මිත්‍ර රජවරුනි, මේ පෝරිසාද රජ්ජුරුවන් තොප හා මවිසින් යළිත් දූෂ්‍යවිය නොහැක්කයි ප්‍රතිඥා ගෙණ පෝරිසාදයත් ළඟට කැඳවා සබඳ රජවරුන් නිදහස් කරපියව් වදාළ සේක.

ඉක්බිති පෝරිසාදයො කඩුව අතින් ගෙණ එක් රජ කෙනෙකුන් එල්වූ ලණු පොට කැපූ පසු දින හතක් නිරාහාරව සිටීමත් භයින් ත්‍රස්තව සිටීමත් නිසා ලණුපොට කැපුණු පසු කෙසෙල්ගසක් කපා දැමූ ආකාරයට බිමට වැටෙන්ට ගත්හ. ඒ දුටු බෝධිසත්වයෝ මහත් කරුණාව උපදවා සබඳ එසේ නොකරව මම මොවුන් අල්ලා ගත් කළ ලණුපොට කපවයි කිය ආදරණීය පියකෙ දරුවෙකු වඩාගන්නා ආකාරයට තම පිට මතට ගැනීමට සූදනම් ඇතුව එක එක රජදරුවන් කරපිටින් ඔසව ඔසවා ගෙනත් බිම සතප්පා දෙඅත්විද එල්ලා තිබූ ලණු පොටවල් ඉවත් කරමින් පැන් පොවා පවන් සලා තුවාල සෝද සැවොම බිම සතප්පා සබඳ පෝරිසාද තුමනි අර ගසෙන් පොත්තක් ගෙණ ගලගාලා ගෙනෙවයි විධාන කළ සේක. පෝරිසාදයෝද එම නුග ගසින් පොත්තක් ගෙණ එසේ කර දුනි. මහබෝසතාණන් වහන්සේගෙ පාරමී බලයත් සත්‍ය ක්‍රියා බලයත් හේතුකොට ගෙණ එම ඖෂධය ගෑ පමණින්ම තුවාල සුවවී පියවි සිහිය ලදහ.

එකල පෝරිසාදයෝද සහල් ගෙණ කැඳ පිස බෝසතාණන් වහන්සේ සමග දින තුනක් කවා පොවා ඔවුන් සුවපත් කළහ. ඉන්පසු බෝධිසත්වයෝ ඔවුන් අමතා තොපගෙ රාජ්‍යයන්ට යාමට තරම් දැන් ශක්තියක් තිබේදැයි විමසූ පසු එරජදරුවනුත් යාමට හැකි බැව් පැවසූහ.

ඉක්බිති බෝධිසත්වයො පෝරිසාද කැඳවා සිය රටට යම්හයි වදාළහ. එපවත් අසා පෝරිසාදයො හඬා වැටෙමින් බෝධි සත්වයන්ගෙ ශ්‍රී පාදයෙහි වැටී සාමිනි නුඹ වහන්සෙ මේ රජදරුවන් රැගෙණ වැඩිය මැනවයි මම වනමුල් ඵලාඵලාහාරයෙන් ජීවත් වන්නෙමි මෙහිම වෙසෙමියි ඇඬූකල්හි සබඳ මේ වනයෙහි ඉඳ මොනවා කරන්නද? බරණැස් නුවරට යම්හයි වදාළ සේක.

එපවත් අසා පෝරිසාදයො ස්වාමීනි කුමක් වදරණ සේක්ද? මම රාජ්‍යයට ගියෙම් නම් නුවරවාසීහු මේ රජතුමා මගෙ මව මරා කෑවයි, පියා මරා කෑවයි යනාදීන් මහත් වූ වෛර ඇත්තාහු මේ සොරා අල්ලා මරාපියවයි කියමින් නොයෙකුත් වධහිංසාවට පත් කර මරාදමතියි කීහ. මම නුඹ වහන්සේගෙන් ලබා ගත්තා වූ පඤ්චශීලය නිසා ජීවිත හානියක් වුවත් විරුද්ධවාදි කිසිවෙකුටත් හානියක් කළ නොහැක. තවද මහරජ මාගෙ ප්‍රියජනක මිනීමස් ආහාරය මටනැති උන නිසා මම වැඩි දවසක් ජීවත්වනවාට විශ්වාසයක්ද නැත. මට නැවත නුඹ වහන්සෙ දකින්ට ලැබේදත් නොදනිමි. එසේ හෙයින් මේ රජදරුවන් සමග ඔබ වහන්සේ සුවසේ වඩින සේක්වායි නැවත කීහ.

ඉක්බිති මහබෝසතාණන් වහන්සේ මහත්වූ කරුණාවෙන් ඔහුගේ හිස පිරිමැද සබඳ තොප ඒ රාජ්‍යයෙහි පිහිටුවමින් සුතසෝම රජ්ජුරුවෝ නම් මමය තොප වැනි තදපරුෂ වූ සාහසිකයකු පවා දමනය කළ මට බරණැස් වැස්සන් මා කීවක් නම් කරත්මය. මම තොප එම රාජ්‍යයෙහි නැවත අග රජ බවට පත් කරවමි. එසේ නොහැකි වුවොත් මා සතු තුන්සියයක් යොදුන් කුරුරට සහ සත්යොදුන් ඉඳිපත් නුවර ඇතුළු වූ සියළු රාජ්‍ය සම්පත්තිය දෙකොටසකට බෙද එකක් දෙමි. එනිසා තොප මා කී

වචනය කළ තැනැත්තන්ගෙ තරම හා දින පුරාතනය සැපයෙහි පිහිටුවා ලී වාම බඳු වූවන්ටම සුදුසුයයි ඔහු රාජ්‍ය සම්පත්තීන් කුල්මත් කරවන සේක්.

මහරජ තොපගේ මුළුතැන්ගෙයි අරක්කැමියන් විසින් මනාකොට නොයෙකුත් ආකාරයෙන් පිළියෙල කරණ ලද රසවත් ආහාරපානාදිය අනුභව කර මින් සැපසේ රාජ්‍ය සම්පත්තිය අනුභව කරන්නා තබාලා කුමණ කාරණයකට මෙම වනයෙහි තව තවත් කටුකව වසන්නෙහිද තවද මහරජ නොයෙක් නොයෙක් දේශයෙහි රජදරුවන් විසින් සරසා එවන ලද නොයෙක් ආභරණ ආදියෙන් තාගෙ සොළොස් දහසක් බිසෝවරුන් ප්‍රධාන කොට ඇති සිය ගණන් නාටිකාවන්ගෙ රැඟුම් බලමින් තොපගෙ සිතෙහි යම් උකටලී බවක් ඇත්නම් එයද නැති කරවන්නේය.

මෙසේ තව තවත් පෝරිසාදයාගේ සිතට වනය එපාකර රාජ්‍ය සැප සම්පත් වර්ණනා කර එතුමාගෙ සිත බෝසතාණන් වහන්සේගෙ අරමුණ කෙරෙහි යොමු කරවාගෙණ නැවත බරණැස් නුරට යාමට සිතක් ඇතිව මෙසේ සිතන්ට විය.

මම මෙතෙක් සිතා සිටියෙ මිනීමස් කෑමෙන් පිට වෙනත් සැපයක් නැති ලෙසටය. එසේවුවත් මාගෙ ගුරුපියාණන් වහන්සෙ උත්සාහ කරන්නේ මම මෙලොවත් ජයගෙණ පරලොවත් ජය ගැනීමට උත්සාහ කිරීමක් බැව් දූන් මට වැටහෙයි එනිසා මම මුන් වහන්සේ තව තවත් වෙහෙසට පත් නොකොට කියන දයකට කීකරුව කටයුතු කිරීමයි තිබෙන්නේ කියා සිතා, මෙතෙක් මම පාපමිත්‍ර ඇසුරක් නිසා පාපයේ, ශාපයෙ, විලාපයෙ, භියකරු බවේ, විනාශයේ, පරිහානියෙ, මාර්ගයට යොමු වූයේ මිනීමස්වල රස දන්වපු අරක්කැමියා නිසයි නමුත් මාගෙ පෙර කුසල් බලයක් ඉදිරිපත් වීම නිසා බුදුරජාණන් වහන්සේ නමක් බඳුවූ මේ සුතසෝම මපියාණන් වහන්සේ මමත් සතරඅපාදුකෙන් ගොඩනගා සෙසු සත්වයාටත් ප්‍රාණඝාතයෙ ආදීනවත්, පඤ්චශීලය රැකීමෙන් සිතට ඇතිවන සිසිල්භාවයත් සියළුම දෙව් මිනිසුන්ට ප්‍රියමනාප භාවයත් මගෙ

ඉදිරි පැවැත්ත සැප විහරණය වෙනුවෙන් තවමත් වෙහෙසන මාගෙ ආචාර්‍යයින් වහන්සේට මින් ඉදිරියට කීකරුව දිවි ගෙවමියි සිතා.

ඉක්බිති ඒ ශ්‍රී මහාබෝධි සත්වයෝ පෝරිසාදයන් හා සියක් රජදරුවන් කැඳවාගෙන වනයෙන් පිටත්ව පසල් ගමකට වන්හ. එසඳ ඒ ප්‍රත්‍යන්තවාසීහු සුතසෝම රජ්ජුරුවන් වහන්සේ දැක යුහුව ඉදිපත් නුවරට ඒ දැන්විය. එකල අමාත්‍යයෝ සිවුරඟ සෙනග ගෙණවුත් රජ්ජුරුවන් පිරිවරා රැකවල් ගත්හ. එකල බෝධිසත්වයෝ සිවුරඟ සෙනග පිරිවරා බාරානසී රාජ්‍යයට නික්මුණාහ. අතරමග දනව්වැසි සත්වයෝ බොහෝ පඬුරු පාක්කුඩම් ගෙණ රජතුමා පිරිවරා කැටුවම නික්මුණාහ, එක් සියයක් රජදරුවෝද පෝරිසාදයෝද බරණැස් නුවරට පැමිණි සේක. එකල පෝරිසාද යාගෙ පුතනුවොත් රාජ්‍යය කරන්නාහුය. සෙනෙවිරද්දුනම් එවකට සිටි කාල හස්ති නම් සෙනෙවිරද්දුමය. එකල නුවර වැසියෝ සුතසෝම රජ්ජුරුවන් වහන්සේ පෝරිසාදයන් දමනෙහිලා කැඳවා ගෙණ එන සේකයි අසා ඔහුට නුවරට ඇතුළුවීමට නොදෙන්නැයි වාසල් එලා ආයුධ රැගත් සේනාවෝ සටනට සූදනමින් සිටියාය.

මහබෝසතාණන් වහන්සේ ඔවුන් සටනට සූදනම්ව සිටින බැව් දැන පෝරිසාදයන් සහ සියයක් රජදරුවන් ඈ තම නවත්වා අමාත්‍යයන් ගණනක් සමග වාසල්කරා ගොස් තමන් වහන්සේ පැමිණි බැව් දන්වා යැවූ සේක. එපවත් අසා රජතුමා හුනස්නෙන් නැගිට වහා දෙර හැර රාජගෞරව සහිතව වඩා ගෙණෙවයි කීහ.

ඉක්බිති බෝධි සත්වයන් වහන්සේද පැමිණි අනෙකුත් ඇමතිවරු කිහිප දෙනාද විවෘත කරණ ලද දෙරින් නුවරට වන් සේක. රජතුමාද සෙනෙවිරද්දුද පෙර ගමන්කොට ගොස් ප්‍රාසාදයට වඩා ගෙණවුත් රාජාසන මස්තකයෙහි වඩා හිඳුවා සිටියාය. එසඳ ශ්‍රී මහා බෝධිසත්වයන් වහන්සේද, පෝරිසාද රජ්ජුරුවන්ගෙ අගමෙහෙසුන් බිසවද, සෙසු අමාත්‍යවරුන්ද, සමීපයට කැඳවා රජ්ජුරුවන් නුවරට වැද්ද නොගන්ට

හේතුව කුමක්දැයි සෙනෙවිරදුන්ගෙන් විචාළ සේක.

එවිට කාල හස්ති නම් සෙනෙවිරද්දු ''මහරජතුමනි, ඒ රජ පෙර මෙනුවර රාජ්‍යය කරණ සමයෙහි බොහෝ ස්ත්‍රී පුරුෂයන් මරමින් මිනීමස් කමින් රජවරු නොකලමනා පහත් ක්‍රියාවක් කල නිසා රටින් පිටුවහල් කළෙමු''යි කීහ. එයින්ද නොනැවතී ඔහුගෙ අරක්කැමියත් සමගම වනවැදී මස් නැති දින අරක්කැමියාත් මරාකාපු කෙනෙක් නිසා අපගෙ බරණැස රාජ්‍යයට ඔහු වැද්ද නොගනිමු.

එපවත් අසා බෝධිසත්වයෝ වදරණ සේක් සෙනෙවිරත්නි දූන් රජතුමා එබන්දක් නොකරති, එයට හේතුව කුමක්ද? යත්. මම ඔහු මෙල්ලකර සීලයෙහි පිහිටා ප්‍රතිඥ ගතිමි. එසේ හෙයින් ජීවිතය පිණිසවත් ප්‍රාණවධ ආදිවූ හිංසා පීඩාවක් නොකරන්නාහුය. මෙතැන් පටන් රජ්ජුරුවන් පිණිස තොපහැමට ප්‍රශ්නයක් ඇතිවුවොත් එය අපට භාරයි එහි වගකීම අප භාර ගනිමුයි වදරා, රාජපුත්‍රයානන්ට අවවාද වදරණසේක් රජ්ජුරුවෙනි, දරුවන් විසින් දෙමාපියන්ට උපස්ථාන කළ යුතුය යම්තාක් දෙමව්පියන්ට උපස්ථාන කලවුන්ට වඩා පළමු දිව්‍යලෝකයට යන්නාවූ සත්වයෙක් මේ ලෝකයෙහි නැත.

එසේම දෙමාපියන්ට දුශ්‍යවූ සත්වකෙණෙක් නිරයට යන්නාහු යනාදීන් රජ්ජුරුවන්ට අවවාද කියා සෙනෙවිරදුන් අමතා කාලහස්තිය තොපද රජ්ජුරුවන්ගෙ අත්‍යන්ත මිත්‍රයෙහි හිතවත් සේවකයෙකි. ඒ රජතුමා විසින්ම ඉතා මහත්වූ පුදුමහේ සීලයෙහි පිහිටුවන ලද හෙයින් තොප විසිනුත් රජ්ජුරුවන් ක්‍රියාවෙහි හැසිරිය යුතුයයි සෙනෙවිරදුන්ටත් අවවාද කියා බිසවුන්ද කැඳවා දේවීනි තොපද කුලයෙන් අවුත් මේ රජ්ජුරුවන් සමීපයෙන් අග මෙහෙසුන් තනතුරු ලදින් සමාන වයස් ඇතිව රජ්ජුරුවන් හා සමගව විසී එක්ව රාජ්‍ය ශ්‍රී අනුභවකරව එහෙයින් තොප විසිනුත් කෙළෙහි ගුණ දූන දේවතාව විසීම උත්තමාංගනාවන්ට සුදුසුයයි යනාදිවූ නොයෙක් පරිද්දෙන් රජ්ජුරුවන්ටද සෙනෙවිරදුන්ටද බිසවුන්ටද ධර්මදේශනා කොට තෙසුත් අමාත්‍ය මණ්ඩලයා හා නුවර වාසීන්ටත් එම්බා

රාජද්‍රෝහ කර්මනම් ඉතා බර දෙයක. එසේ හෙයින් තොප හැම විසිනුත් ඒ රජහට ඇගිය නොහැක්කැයි කාරණා කිම්ද යත්

තොපගෙ මේ රාජ්‍යයට ප්‍රවේණි රජය, ළදරු වයස සිටියේය. මා අතින් සත්පුරුෂ ධර්මය අසා සතුටුව සතර වරයක්දී දශරාජ ධර්මයෙහි පිහිටියේය. එසේ හෙයින් ඔහු කෙරෙහි කිසි අහිතක් නොසිතවයි නුවර වැස්සනුත් එම ලෙස අස්වසා ධර්ම දේශනා කළ සේක. මෙසේ ඒ සර්වඥවිලාසයෙන් වදරණ ලද කෘතොපකාර සංඛ්‍යාත වූ බණ කථා අසා රජ්ජුරුවෝද, සෙනෙවිරදුද, බිසවුද, නුවරවාසි වූ මහජනයාද, සතුටුව බෙර ගස්වා නුවර සරසවා සියලු නුවරවාසීන් රැස්කරවා රජතුමා ධර්මිෂ්ටයෙහි පිහිටියේල.

දැන් තොප කිසිවෙක් භිය නොවව් යනාදීන් නුවරසීන් අසා මහ රජ්ජුරුවන් වඩා නුවරට ගෙනෙම්හයි මහසෙනග සමගින් එක්ව මහබෝසතාණන් වහන්සෙ ගොස් සුවඳපැන් සොළොස් කළයක් නහවා සත්රුවන් රැසක් මත්තෙහි සිටුවා, නුවර පැදකුණු කරවා රජගෙට වඩා ගෙණ ගියහ. එසඳ ඒ රජ්ජුරුවන්ට අප්‍රමාණ වූ ඓශ්වර්‍ය්‍ය ඇතිවිය පෝරිසාද රජ්ජුරුවෝ සුතසෝම රජ්ජුරුවන් හා සියයක් රජදරුවන් හා මහත් සත්කාර සම්මාන කළහ.

සුතසෝම නරේන්ද්‍රයාණන් වහන්සේ විසින් පෝරිසාදයන් දමනය කර රජයෙහි පිහිට වූ බැව් මුළු දඹදිව පුරාවට පැතිර ගියේය. මහා බෝධිසත්වයෝ ඒ රජහු විසින් කරණ ලද සත්කාර විඳිමින් මසක් පමණ එහි දවස් යවා, පෝරිසාදයන් කැඳවා සබඳ මෙතැන්හි දන්සැල් පහක් කරවා දුගී මගී වනිබ්බක යාචකයන්ට මහදන්දී දශරාජ ධර්මය කඩනොකොට රාජ්‍ය කරවයි අවවාද කොට ඒ රජ්ජුරුවන් දූතයන් දැක අප නික්මෙන කාලයයි වදරා බලඇණි සේනාව පිරිවරණ ලදුව නුවරින් නික්මුණු සේක්, පෝරිසාද රජ්ජුරුවන් විසින්ද පසු ගමන්කොට නික්ම දෙමංසන්ධියෙහි සිට වැඳ සමුගෙණ නැවතුනාහ.

සෙසු රජදරුවෝද මහබෝසතාණන් වහන්සේ වැඳ සිප ගැනීම්

ආදිවූ සාමිචිකොට මහබෝසතාණන් විසින් දෙන ලද යාන වාහනාදියට නැගී ක්‍රමයෙන් තම තමන්ගේ සියරටට පිවිසීය, මහබෝසතාණන් වහන්සේ ඉදිපත් නුවර වැසියන් විසින් දිව්‍යපුරයත් මෙන් සරසන ලදුව ඇතුළු නුවරට වැද නුවර තුන්විටක් පැදකුණු කොට ප්‍රාසාදයට නැගී දෙමව්පියන්ට වැඳ පැදකුණු කොට මිහිරි ප්‍රිය වචන ක්ථා කොට එදවස් පටන් සතරසංග්‍රහ තින් වියො නොව දැහැමෙන් රජ කරණ සේක් මෙසේ සිතුසේක.

කෙසේද? යත්

වෘක්ෂ දේවතාවා මට බොහෝ උපකාරිව සිටියේය. එනිසා ඔහුට ප්‍රති උපකාරයක් කළ යුතුය. නුග ගසට අසන්නව මහ වැවක් බඳවා බොහෝ මනුෂ්‍යයන් යවා එතැන්හි මහ ගමක් කරවූ සේක. එගම මහත කොපමණද යත් මේ සත්ව ලෝකයෙහි පවත්නා වූ වස්තුවෙන් අසවල් දෙයක් මෙහි නැතැයි කියන්ට නැත.

කස්තුරි, කපුරු, සඳුන්, කළුවැල්, ළමගතකුල්, පටපිළි, දෙවංග, මුතුමැණික් රන් රිදී ආදිවූ නොයෙක් වස්ත්‍රාභරණයෙන් සුගන්ධාපන රත්නාපනාදී වූ අසූදහසක් සල්පිල් ඇත්තේය. ඒ නුගගසද ශාඛා මණ්ඩලයෙහි පටන්ගෙණ සමතලකොට වට පවුරු බඳවා සතර දෙරින් යුක්ත කොට දවස්පතා සුවඳ තෙල් පහන් නගා රසමස වූලෙන් යුක්ත වූ ආහාරය රන් තලියෙහි පුද කරණ ලද ප්‍රජාසත්කාර අපමණය.

දෙවතාද මහබෝසතාණන් වහන්සේ කෙරෙහි අතිශයින් ප්‍රසන්නව සියලු උපද්‍රව නිවාරණය කෙරෙමින් රැකවල් ගත්හ. ඒ ගම වනාහි පාපකර්මයෙහි ව්‍යාපෘත වූ පාපි පුද්ගලයන් දමලේලු තැන කරණ ලද හෙයින් 'කම්මා සසදම්ම' නම් නියම්ගම වියයි ඉරහඳ පවත්නා තෙක් ප්‍රසිද්ධ කොට වදළ සේක. දැන් වර්තමානයෙහි එම කම්මසස දමම නම් නියම්ගම වැඩහිඳ චත්තාරො සතිපට්ඨානා, ඉධ භික්ඛු අජක්ධත්තංකායෙ කායානුපස්සි විහරති, බහිද්ධා වාකායෙ කායානුපස්සි විහරති, අජක්ධත්තබහිද්ධා වාකායෙ කායානුපස්සි විහරති, අතාපි සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජක්ධා දෙමනස්සං.

යනාදීන් සතිපට්ඨාන සූත්‍ර දේශනාව දශසහ ශ්‍රී ලෝකධාතු උපුල්වා වදළ සේකැයි දතයුතු. මෙසේ මහබෝසතාණෝ සියළු ජම්බුද්වීපයෙහි රජදරුවන්ට අවවාද අනුශාසනා කොට තමන් වහන්සේද දශරාජ ධර්මයෙන් රාජ්‍යය කොට සහ පිරිවරින් දෙව්ලොව වැඩිසේකැයි යනාදීන් භාග්‍යවතුන් වහන්සේ මේ ජාතක කථා ධර්මදේශනාව ගෙණහැර දකවා වදරා මහණෙනි, මොහු දැන් මතු නොවෙයි පෙරත් මෙලෙස සමනය කළෙමි, යි වේදැයි පූර්ව පරසන්ධි ගලපා මහණෙනි, එකල පෝරිසාදයො නම මෙකල අංගුලිමාල ස්ථවිරයෝයි. එසමයෙහි කාලහස්ති නම් සෙනෙවිරද්දූ මෙකල මාගෙ ශාසනයෙහි ධර්‍මයට සෙනෙවිරදදූ දම්සෙනෙවි සැරියුත් මහතෙරහුය. ඒදවස් සතාරහ ගාථා පඬුරක්කොට ගෙණවුත් මා සමීපයෙන් බොහෝ උපකාර ගන්නා ලද්දවූ නන්ද බ්‍රාහ්මණ නම් ආනන්ද මහතෙරහුය. එකල වෘක්ෂ දේවතාවා නම් දැන් බුද්ධානුබුද්ධ තපොනිධාන වූ මහාකාශ්‍යප ස්ථවිරයෝය. ඒදවස් උපදෙස් දයක වූ ශක්‍රදේවේන්ද්‍රයෝ නම් දැන් දිවැස් ඇත්තවුන් කෙරෙහි අග්‍ර වූ අනුරුද්ධ ස්ථිවිරයෝය. සෙසු සියක් රජදරුවෝ නම් මේ බුදු පිරිසමය. එදවස් දෙමව්පිය දෙදෙනාම මෙදවස් සුද්ධෝදන සහ මහාභායා දෙනොය, එකල ඒසා මහත් ලෝවැඩ කළා වූ සුතසෝම රජ්ජුරුවෝ නම් ලොවුතුරා බුදු වූ මම්මවේදැයි තමන් වහන්සේ දක්වා වදළ සේක.

සම්පාදනය 2010.08.21 කළුතර 49 ආබෘ පාර.

අසීතිනිපාත වණ්ණනා නිට්ඨිතා.

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**

අළුගල්ලෙන ආරණ්‍ය සේ:

දඹෙගොඩ,

මාළිගාවිල.

2014-02-14

# මේ අබුද්ධස්ස කාලයේ ආරම්භයද?

මෙලොව පහළවූ ප්‍රධානම ආගම් ශාස්තෘවරයාණන් වහන්සේලා අතුරින් මහා අහිංසාවාදියාණන්, මහා කාරුණිකයාණන් මහා ශාන්ති නායකයාණන්, මහා මෛත්‍රී මූර්තියාණන් යන අති බලසම්පන්න අන්වර්ථ නාමවලින් හඳුන්වන එකම ශාස්තෘවරයාණන් වහන්සේ අප මහා සම්‍යක් සම්බුද්ධ වූ බුදුපියාණන් වහන්සේමය. මෙවන් උතුමකු තවත් ජීවත්වීමට කැමැත්තෙන් සිටින ජීවිතය දන්නොදුන් කෲර ලෙස මරණ ලද ජීවියකුගේ මාංශ වැළඳූවා යැයිද, එවැන්නක් අනුමත කළා යැයිද, සිතීම, ප්‍රකාශ කිරීම සහ ලිවීම වනාහි වෙනත් මිථ්‍යාදෘෂ්ටික නිරතුරු මාංශ භක්ෂක ආත්මාර්ථකාමී, ආත්මවාදී ආගම් ධර්මයන් හමුවේ උන්වහන්සේ බලවත් සේ අනාථකොට දැමීමකි.

අපගේ මහා අනාථනාථයන් අමු අමුවේ කෙළෙසා දැමීමකි. යම් අයෙක් මාංශ අනුභවයට රුචියක් දක්වන්නේ නම් හේ තම හැරදමා යන ශරීරය පෝෂණය ගැනම සිතා පංචකාමයේ ඇලී ගැලී සිටින මහා ආත්මාර්ථකාමියෙකි. තමන්ගේ පුද්ගලික රුචි අරුචිකම් ගැනම තකන්නෙකි. තම දිවග රසය, කෙසේ හෝ ලබාගත යුතු යැයි සිතන්නෙකි. සුදනිඟ සුදන සාධුනිඟ බුද්ධිමත් බෞද්ධයා එසේ නොවේමය. අප මහා අවිහිංසා දර්ශනයේ විශේෂභාවය එයමය.

බුද්ධිමතා සිතන්නේ යමකු ආහාර අනුභව කළ යුත්තේ ජීවත්වීමට ශරීරය පවත්වාගෙන යෑමට පමණක් බව කියාය. එවන් බුද්ධිමතුන් ජීවිතය ගත කරන්නේ ආහාර අනුභවය සඳහා නොවේමය. ආහාරයකින් කෙරෙන්නේද ශරීර අභ්‍යන්තරයේ සාධාරණ ක්‍රියාවලියකි. ශරීර යන්ත්‍රයේ අවයවවලින් මිනිස් තිරිසන් භේදයකින් තොරව කෙරෙන්නේද ආහාරයෙන් එම අවයව අයත් සත්වයාව ස්වභාවයේ න්‍යාය ධර්මතාව අනුව ජීවත් කරවීමය.

මාංශ භක්ෂක තිරිසන් සතුන් පවා ඔවුන්ව තව සතකු විසින් මරා කනවාට අකමැතිය. භීතියට පත්ව සිය පණ නල රැක ගැනීමට වලිකති. ශබ්ද නගති. විලාප දෙති. එම නිසයි සම්බුද්ධ දේශනාවල සියලු සතුන් කෙරෙහි මෛත්‍රීය මනාව වැඩිය යුතු යැයිද, ඒ සඳහා වේලාවක් කලාවක් නොමැති බවද සඳහන්ව ඇත්තේ. (කරණීය මෙත්ත සූත්‍රය)

ඇතැමුන් බුද්ධ පූජාවට මස්, මාංශ, බිත්තර (නූපන් දරුවන් මරා) පවා තබනවා. කුකුල් එහෙම පිටින් තම්බා ස්ටු කර රසකාරක දමා බැද සකස් කර පූජාවට තබනවා. මසුන්ගේ කුස තුළ සිටින බිත්තර හෙවත් දරු පැටවුන් දස දහස්, ලක්ෂ ගණන්, මවු මසුන් සමගින්ම උයා, බැද රසමසවුලෙන් සකස් කර උතත්ම බුද්ධ පූජාවට තබනවා. මසුන් මියයන

විටදී විඳින මරණ වේදනාවම මෙලොව එළිය නොදැක මියයන මාළු දරුවන්ද විඳින බව මෙම උත්තමයන් නොදනිති. නොදකිති. දැනගත්තේද හුදු ආත්මවාදී චේතනාව කරනකොට ගෙන එය නොතකති. තෘෂ්ණාවෙන් සිහි විකල්ව ගොසින්ය.

මෙවන් බුද්ධ පූජා සිරිලක පුරා බොහෝ පන්සල් භූමි තුළ සිදුකරමින් මම ප්‍රාණඝාත නොකරමි, නොකරවමි, අනුන් සතු දේ බලෙන් වධයෙන් මංකොල්ලයෙන්, සොරකමින් පැහැර නොගන්නෙමි. අනුබල නොදෙමි. යළි යළි තමන් නිතිපතා නොකරන දේ ගැනම පුන පුනා පවසමින් ප්‍රථම, දෙවැනි ශික්ෂාපද බිඳ දමමින් සිය පරලොව සැපත පතා අනුන්ගේ දුකම බුද්ධ පූජාවටද නිර්ලජ්ජිතව පූජා කරති. තමන්ද වළඳති.

යම් ඉදිරි කාලෙකදී බුදුරජාණන් වහන්සේද බඩේ අජීර්ණයක් අවසානයේදී වැළඳූනා නොවේදැයි පවසමින්, මත්පැන් වීදුරුවක්ද, බුද්ධ පූජාවට තැබීම, මෙවන් පූජා කරමින් පින් ලබා ගන්නට තැත් කරන බුද්ධි අන්ධයන්ට අපහසු නැත. පළමු, දෙවැනි, තෙවැනි, සතරවැනි සිල්පද සිඳ ගැනුම පිළිබඳව කුමන අවවාද අනුශාසනාද? එයට තව තවත් අටුවා ටීකා අවශ්‍යද? ඔවුන්ට එයද සුළු දෙයකි.

මෙලොව හැරදමා යන දෙය පමණක් ඔවුන් මනාව සුරකියි. හරි හම්බ කර ගනියි. ඔලගුවක්වත් නැතිව චුතවී සතර කතරේ අනාථ වේ. ගැලවුමක් නම් නැත. මේ සියල්ල සිදුවන්නේ සම්බුදුන් වහන්සේම දෙසා වදාළ පරිදි 'ඒහි පස්සිකෝ' මගේ දහම එව බලව යන්න ගැන කිසිදු වැටහීමකින් තොරව කරන්නන් වාලේ කරන අයවලුන්ටය. නොදැන වස බිව්වත් දැන වස බිව්වත් ප්‍රතික්‍රියාව එකම බව දැන්වත් දැනකියා ගැනීම තමන්ගේම යහපතට හේතුවන්නේය.

දළඳ වහන්සේට තැබෙන ව්‍යාංජන තිස් දෙකක් සහිත නිර්මාංශ බුද්ධ පූජාවම උදහරණයට ගැනුම වටී. එසේ නැතහොත් සිදුවන්නේ උපපජ්ජවේදනීය අකුසල කර්මය හෝ අපරාපරියවේදනීය අකුසල කර්මය හෝ අනිවාර්යයෙන්ම ලබා ගැනීමකි. එයින් කිසිසේත් ගැලවීමට හෝ මිදීමට නම් නොහැකි බව වටහාගන්න.

වර්තමානයේ මෙම පවතින ආකාරය දෙස ධර්ම සංවේගයෙන් යුතුව බලනවිට අපහට හැඟීයන්නේ බුද්ධෝත්පාද කාලය අවසන්වී ඇතිසේය. දැන් දැන් අබුද්ධෝත්පාද කාලය ළඟාවෙමින් පවතී. මෙය අබුද්ධස්ස කාලයේ ආරම්භයයි. හැකිනම් බුද්ධිමතුනි, ගැලවීමට යත්න දරන්න.

සියලු දනයන්ට වඩා ධර්මදනය උතුම්ය. අභයදනය උතුම්ය. මේ දෙවර්ගයෙන්ම ඇතිවන්නේ පරම මෛත්‍රී කුසල චේතනාවන් මෙන්ම කුසල කර්ම විපාකයන්ය. බුද්ධිමතුනි, ප්‍රථම සිල්පදය හෝ සිහි බුද්ධියෙන් රැක උතුම් බුද්ධ පූජාව සකස් කරන්න. පූජා කරන්න. තිසරණ සරණයි.

බුදු මග - දිවයින
14-04-2014 බක් පොහොය

# ලක්ෂ 10 ක් අතින් ගෙවා වැල්ලවාය ප්‍රා. සභාපති ගව ඝාතකාගාරය වසයි


(මොනරාගල සංයුක්ත බණ්ඩාර සහ වැල්ලවාය පී.ඇයි. ඉන්දිකා)

තම පදනමේ අරමුදලින් රුපියල් ලක්ෂ 10 ක් වැල්ලවාය ප්‍රාදේශීය සභාවට ගෙවා මේ වසරේ ගව මස් ටෙන්ඩරය මිලට ගෙන වැල්ලවාය ගව ඝාතකාගාරය සහ ගව මස් වෙළෙඳසැල වසා දමන ලදැයි වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ සභාපති, රෝහණ වන්නිආරච්චි මහතා පවසයි.

6 වැනි පිටුවට



වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ සභාපති රෝහණ වන්නිආරච්චි



අසූහිය පළමුවැනිදා සිට මෙම ගව ඝාතකාගාරය සහ වෙළෙඳසැල වසා දමා ඇත.

සභාපතිගේ මේ තීරණය නිසා වසරකට අඩු ගණනේ ගවයන් 1500-2000ක් අභය ගණනකට අභය දානය ලැබේ.

වැල්ලවාය ප්‍රාදේශීය සභාවට අයත් මෙම ගව ඝාතකාගාරය හා ගව මස් වෙළෙඳසැල වසරකට රුපියල් ලක්ෂ 12 සිට 14 දක්වා මුදලකට ටෙන්ඩර් වන බවත්, මේ වසරේ රුපියල් ලක්ෂ 10ක් ගෙවූයේ රෝහණ වන්නිආරච්චි සදහමින් බවත්, ගිය වසරේ ද රොයල් කොන්ස්ට්‍රක්ෂන් අධිපති රාජන් ද සිල්වා මහතා රුපියල් ලක්ෂ 14ක් ගෙවා ටෙන්ඩරය මිලට ගෙන ගව ඝාතකාගාරය සහ ගව මස් වෙළෙඳසැල වසා දැමූ බවත් සභාපති වන්නිආරච්චි මහතා කීය.

වැල්ලවාය ගව මසින් තොර නගරයක් කිරීමට තම පදනමින්, ඊට සහාය දක්වන සංඝරත්නය හා සියලු සංවිධානත් එකමුතු වී වැඩකරන බවද සභාපතිවරයා ලංකාදීපය සමඟ පැවසීය.

සත්ත්ව හිංසා වැළැක්වීමේ වැඩපිළිවෙළක් ද ආරම්භ කළ බව ඔහු කීවේය.

ප්‍රාදේශීය සභාපතිගේ තීරණය පිළිබඳව වැල්ලවායේ සියලු වෙහෙර විහාරවල මහා සංඝරත්නයේ ප්‍රසාදය හිමි වී ඇත.

ඌව පළාතේ ප්‍රධාන සංඝනායක ඇතිලිවැව හිමිරතන හිමියන් පවසුවේ සභාපතිගේ මේ තීරණයෙන් උපන් හා නූපන් ගවයන් දහස් ගණනකට ජීවිත දානය ලැබෙන බවයි.

අතුත් දිනක තණමල්විල ප්‍රදේශයේ දී වෑන් රථයක් සහ ත්‍රිරෝද රථයක් ගැටීමෙන් වැල්ලවාය ප්‍රදේශයේ පදිංචි එකම පවුලේ සිව්දෙනෙකු මියගිය අතර ඔවුන්ගේ අවසන් කටයුතු සිදු කෙරුණේ ද ප්‍රාදේශීය සභා සභාපති රෝහණ වන්නිආරච්චි මහතාගේ මැදිහත්වීමෙනි. මෙම අනතුරෙන් මියගිය එකම පවුලේ මව, පියා හා වැඩිමහල් දියණියටත් පින් පතමින් සහ දැනට හම්බන්තොට රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින බාල දැරියටත් ඉක්මන් සුවය ප්‍රාර්ථනා කොට වැල්ලවාය ගව ඝාතකාගාරය මේ වසරේ වසා දමන බවට ප්‍රසිද්ධියේ ප්‍රතිඥාවක් ද දී සිටිති.

මුද්‍රණය : තිරසවි ප්‍රින්ටර්ස් 0112 569192, 077 9620359